
2017 දෙසැම්බර්
01 කාණ්ඩය 03 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD


සටන් කරන තාරුණ්‍යයට



සුදු බිමක පිපි රතු කුසුම... 02




ලොක්කන්ගේ දාම්පෙතක් වූ ක්‍රිකට්... 09



තරුණයාට සිදු වී තිබෙන්නේ... 11



අරුම පුදුම විශ්වය... 14



# සුදු බිමක පිපි රතු කුසුම



'මම....
නොනැසී පවතිමි...
නොනැවතී ඉදිරියටත්...
මුල් ඇදගත් ජීවිතයක
රතු කැලෑ පොපි මලක්
වීම ගැන සතුටින්...''
-මැරිලින් බක්-

ශ්‍රේෂ්ඨත්වය බිහිවන්නේ මල්දම්, ප්‍රතිමා, ප්‍රශස්ති, සැමරුම් පුරවාගත් බොල් වීරයින්ගෙන් නොව, මිනිසාගේ යහපත වෙනුවෙන් තම ජීවිතය කැප කළ සරල මිනිසුන්ගෙනි. එවන් මිනිස් පවුරක තවත් එක් ශ්‍රේෂ්ඨ නියමුවරියකගේ කතාවයි මේ.

ඇය නමින් මැරිලින් ජීන් බක් විය. ඈ 1947 දෙසැම්බර් 13 දා ඇමරිකාවේ ටෙක්සාස්හිදී උපත ලැබීය. ඇගේ පියා ලුවිස් බක් බිෂොප් පාලක සභාවේ අමාත්‍යවරයෙක් වූ අතර ඇගේ මව හෙදියක් වූවාය. එවකට ඇමරිකාවේ ක්‍රියාත්මක වූ 'සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ' ප්‍රබල ක්‍රියාකාරිකයෙක් වීම නිසා ඇගේ පියාව එම තනතුරින් නෙරපනු ලැබීය. 1960 දශකයේදී ටෙක්සාස් සරසවියට ඇතුළත් වූ මැරිලින් සිය ප්‍රථම ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය, වියට්නාමයට එරෙහි ඇමරිකානු ආක්‍රමණයට විරුද්ධව කරන ලද ක්‍රියාකාරකම් තුළින් ඇරඹීය. ජාතිවාදයට එරෙහි සටන් පෙරමුණේ ක්‍රියාකාරිණියක ලෙස 'ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා වූ ශිෂ්‍යයෝ' සංවිධානය තුළත් කාන්තා අයිතීන් වෙනුවෙන් කළ සටන් තුළත් පලස්තීන නිදහස සඳහා වූ අරගල තුළත් මෙන්ම ඉරානයට හා වියට්නාමයට එරෙහි ඇමරිකානු යුද්ධවලට එරෙහි සටන් තුළත් ඇගේ ක්‍රියාකාරීත්වය පෙරමුණේම විය.

1970 දී පමණ ඇය 'කළු ජාතික විමුක්ති ව්‍යාපාරය' හා එක්විය. පසුව Black Panther Army (BPA) නම් වූ එහි සන්නද්ධ අංශයට එක් වී එතැන් සිට සන්නද්ධ ක්‍රියාකාරීත්වයටත් රහසිගත දේශපාලනයටත් යොමු විය. 1973 දී වෙඩි බෙහෙත් මිලදී ගැනීමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ ඇය එහිදී දස වසරක සිරදඬුවම් ලැබීය. එහෙත් 1979 දී සිරගෙය බිඳදමා එයින් මිදී ගිය මැරිලින් පසුව රහසිගතව තම ක්‍රියාකාරීත්වයන් සිදු කළාය. 1981 දී බ්‍රින්ක්ස් මෙහෙයුමටත් 1983 දී ඇමරිකානු සෙනෙට් සභාවට බෝම්බ ප්‍රහාරයන් එල්ල කිරීමේ මෙහෙයුමටත් සහභාගී වූ ඇය 1985 දී නැවතත් අත්අඩංගුවට පත්වී සිරගත කරන ලදී. එහිදී ඇයව ජීවිතාන්තය දක්වා සිරගත කළ අතර එතැන් පටන් ඇගේ දේශපාලන ක්‍රියාකාරීත්වය පන්හිඳෙන් ලියැවෙන කවි බවට පත්විය.

62 වසරක් වූ තම ජීවිතයෙන් වසර 33ක්ම ඇමරිකා එක්සත් ජනපදයේ උපරිම රැකවල් යොදා තිබූ සිරගෙවල් තුළ ගෙවා දැමූ ඇය මිය යන තෙක්ම ඇමරිකානු කළු මිනිසුන් වෙනුවෙන්ද පලස්තීනය, වියට්නාමය, කියුබාව හා ග්‍රැනඩාව ඇතුළු ඇමරිකා එක්සත් ජනපදයේ යුධ, දේශපාලන ශාපයට ගොදුරු වූ රටවල් කෙරෙහිද වූ අසීමිත සහෝදරත්වය එක බිඳකුදු අඩු කර නොගෙන සටන් වැදුණාය.

මනෝ විද්‍යාව පිළිබඳ BA උපාධියක්ද කාව්‍යකරණය පිළිබඳ MA උපාධියක්ද හිමි ඇයට ඉංග්‍රීසි හා ස්පාඤ්ඤ භාෂා ද්විත්වයම එකලෙස හසුරුවන්නට හැකිවිය. උගන්ඩා කිවිඳියක වූ පෙරී රෝසි ගේ 'පිටුවහලේ සිට' නම් කවි පොත මැරිලින් විසින් පරිවර්තනය කළාය. කොමියුනිස්ට්වාදිනියක වූ මැරිලින් බක් කාන්තා ක්‍රියාකාරිණියක ලෙසත් ශිෂ්‍ය නායිකාවක ලෙසත් සෙබළියක හා කිවිඳියක ලෙසත් කළු මිනිසුන් ඇතුළු සමස්ත මානව ප්‍රජාවේම නිදහස වෙනුවෙන් තම ජීවිතය කැපකළ නියමුවරියක වූවාය. සැබවින්ම ඇය සුදු බිමක පිපි රතු කුසුමක් සේ ලෝකය පුරාම මිනිසත්කමේ සුවඳ විදාලීය.

## ඉල් මහ විරුවන් සමරයි



ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු පක්ෂය වෙනුවෙන් දිවිපිදූ සියලු සාමාජිකයින් සිහි කරමින් පැවැත්වූ 28 වැනි ඉල් මහ විරු සැමරුම කොළඹ විහාරමහාදේවි එළිමහන් රංග පීඨයේදී පසුගිය නොවැම්බර් 13 දින පැවැත්වීය.

එහි දී ජනතා විමුක්ති පෙරමුණේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක සහෝදරයා හා ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ඇතුළු පක්ෂ සාමාජික සාමාජිකාවන් විසින් ඉල් මහ විරුවන්ගේ ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීමෙන් පසු පහන් දල්වා ඔවුනට ගෞරවය දැක්වීය.

මෙහිදී ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා සහ ටිල්වින් සිල්වා සහෝදරයා විසින් සමරු දේශන පැවැත්වූ අතර ඉන් අනතුරුව සමරු ගී ප්‍රසංගයක්ද පැවැත්විණි. එහිදී මිත්‍ර කපුගේ, චන්ද්‍රසෝම බිංදුහේවා, ප්‍රසන්නජිත් අබේසූරිය, සූරිය කුමාර මුත්තලගේ හා රන්දිල් ද සිල්වා යන කලා කරුවන් සමඟ සමාජවාදී කලා සංගමයේ ගායක කණ්ඩායම ගීත ගායනා කළ අතර අශෝක ජයවර්ධනයන් ප්‍රමුඛ වාද්‍ය වෘන්දය විසින් සංගීතය සපයන ලදී. මෙම අවස්ථාවට කලාකරුවන් හා පක්ෂ සාමාජිකයින් රැසක්ද සහභාගී වූහ.

## "මධ්‍යම කඳුකරයේ විනාශය රටේ අනාගත මරණයයි" කෘතිය එළිදකී



ජීවයේ අයිතිය සංවිධානය මඟින් "මධ්‍යම කඳුකරයේ විනාශය රටේ අනාගත මරණයයි" යන මැයෙන් කෘතියක් එළිදක්වන ලදී.

ඒ "මධ්‍යම කඳුකරයේ විනාශය රටේ අනාගත මරණයයි" මැයෙන් රට පුරා සංවිධානය කරනු ලැබූ සම්මන්ත්‍රණ මාලාවට සමගාමීව මහනුවර හන්තාන තේ පර්යේෂණායතන ශ්‍රවනාගාරයේදී පැවත්වූ සම්මන්ත්‍රණයක් අතරතුරේදීය.

එහි ප්‍රධාන දේශන මහාචාර්ය ලියනගේ අමරකීර්ති මහතා, ආචාර්ය ජයන්ත ලාල් රත්නසේකර මහතා හා ජීවයේ අයිතිය සංවිධානයේ කැඳවුම්කරු සමන්ත විද්‍යාරත්න සහෝදරයා විසින් සිදු කළහ.

## ඔක්තෝබර් විප්ලවයේ සැමරුම් සඳහා ජ.වි.පෙ. නියෝජිතයෙක් එතෙරට



බංගලාදේශ සමාජවාදී පක්ෂය විසින් සංවිධානය කරනු ලැබූ ඔක්තෝම්බර් විප්ලවයේ සියවස් සැමරුම් උත්සවයක් සඳහා ජනතා විමුක්ති පෙරමුණට ලද ආරාධනාවක් අනුව ජ.වි.පෙ. ජාතික සංවිධායක, පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා ඊට සහභාගී විය. එම සැමරුම් වැඩසටහනට සහභාගී වීමෙන් අනතුරුව බිමල් රත්නායක සහෝදරයා වියට්නාමය බලා පිටත් වීමට නියමිතය. ඒ වියට්නාම් මිත්‍රත්ව සංගමයේ සමුළුවකට හා වියට්නාම් කොමියුනිස්ට් පක්ෂය විසින් පවත්වනු ලබන තවත් ඔක්තෝබර් විප්ලවයේ සියවස් සැමරුම් වැඩසටහනකට සහභාගී වීම සඳහාය.

## සෙවණගල දී උක් ගොවියෝ පාරට බසිති



හිඟුරාන, පැල්වත්ත සහ සෙවණගල ආදී ප්‍රදේශයන්හි උක් ගොවීන් සෙවණගල, දණ්ඩුම මංසන්ධියේ දී පසුගිය 15 වන දා විරෝධතාවක නිරත වූහ. ඒ තම ගැටලුවලට විසඳුම් ලබා දෙන ලෙස ඉල්ලමින්ය.

සමස්ත ලංකා ඒකාබද්ධ උක් ගොවි බලමණ්ඩලය හා සමස්ත ලංකා ගොවිජන සම්මේලනය එක්ව මෙම විරෝධතාවය සංවිධානය කර තිබුණි. උක් ටොන් 01ක මිල රුපියල් 8,500ක් දක්වා ඉහළ දැමීම, උක් වගා කරන ඉඩම්වල අයිතිය ගොවීන් වෙත ලබාදීම, වගාව සඳහා පොහොර සහනාධාරය වහා ලබා දීම, උක් සමාගම් විසින් ලබා දෙන ණය පහසුකම් සඳහා අයකරන අසාධාරණ පොළිය අහෝසි කිරීම, ප්‍රමිතියෙන් තොර බීජවලින් සිදු කරන වගා හානියටත්, වසංගත රෝග හා බරපතල ස්වභාවික විපත්වලදීත් උක් සමාගම් විසින් ගොවියාට වන්දි ගෙවීම, අස්වනු නෙළීමේදී සමාගම්වල ප්‍රමාදය නිසා සිදුවන පාඩුවට සමාගම් විසින්ම ගොවියාට වන්දි ගෙවීම, කර්මාන්ත ශාලාවේ දුමත් සමඟ පිටවන අපද්‍රව්‍ය නිසා සිදුවෙමින් පවතින පරිසර හා සෞඛ්‍ය ගැටලු විසඳීමට වහා පියවර ගැනීම, කර්මාන්ත ශාලාවල සේවය කරන සියලු සේවකයන්ට ජීවත් වීමට සරිලන වැටුපක් හා අනෙකුත් දීමනා වහා ලබාදීම, ස්ථිර නොවන සේවකයන් වහා ස්ථිර කිරීම, ගොවියා හා සමාගම අතර ද්විපාර්ශවීය සම්බර ගිවිසුමක් ඇති කිරීම යන ඉල්ලීම් 10 මුල් කරගනිමින් මෙම උද්ඝෝෂණය පැවැත්විණි.

මේ සඳහා සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපති නාමල් කරුණාරත්න සහෝදරයා හා ගොවි නායකයින් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

# මෙවර අයවැයේ "තරුණයන් සවිබල ගැන්වීම" ඇත්තේ වචනවල පමණයි



*ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික, පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා සමඟ කළ සංවාදයකි.*

**මෙවර අයවැය රටේ ආර්ථිකයට කෙබඳු බලපෑමක් ඇති කරයිද? එම තත්ත්වය රටේ ජනතාවට කෙසේ බලපායිද?**

2018 අයවැය ඉදිරිපත් කිරීමේදී මංගල සමරවීර මුදල් ඇමතිවරයා සඳහන් කරපු ආකාරයටම මේ අයවැයත් ඔවුන් අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තියම ඉදිරියට ගෙනයාමක්. එය වසර 40 පුරාම අපේ රටේ ක්‍රියාත්මක වුණු නවලිබරල් ආර්ථික ක්‍රමයයි. ශ්‍රී ලංකා, යූඑන්පී පක්ෂ දෙක වසර 40 ක් තිස්සේ මාරුවෙන් මාරුවට පවත්වාගෙන ආ ආර්ථික ක්‍රමයම දැන් දෙගොල්ලො එකතු වෙලා පවත්වාගෙන යනවා. නමුත් අපි සලකා බැලිය යුතු ප්‍රධානම කරුණ තමයි ගතවුණු දශක 04 තුළ මේ ආර්ථික ප්‍රතිපත්තියට රට අඟලක් හෝ ඉස්සරහට ගෙනයන්න පුළුවන් වුනාද කියන එක. අසමත් ආර්ථික ප්‍රතිපත්ති තුළින් රට මත විශාල ණය කන්දක් ගොඩගහලා තියෙනවා. ඒ ණය කන්ද මීතොටමුල්ල කුණු කන්දට වඩා විශාලයි කියලා මුදල් ඇමතිවරයාම කියනවා. ඒ වගේම රාජ්‍ය ආදායම දළ ජාතික නිෂ්පාදනයෙන් 15%ක ටවත් ළං වෙලා නෑ. රාජ්‍ය ආදායමෙන් 82% ක්ම බදු ආදායම්. එයින් වැඩිපුරම පවතින්නේ වක්‍ර බදු. ඊළඟ අවුරුද්දෙ ණය සහ පොළී වාරික, ඇති නැති පරතරය වේගයෙන් වැඩිවෙනවා. මේ ආර්ථික ප්‍රතිපත්තියට රටේ කිසිඳු අංශයක් සංවර්ධනය කරන්න බැරිවෙලා තියෙනවා. අඩු තරමේ අවුරුදු 40ක් තිස්සේ ඔවුන් පාරම්බාපු ලෙසින් විදේශ ආයෝජකයින් හෝ ගෙන්වාගන්නත් බැරි වෙලා තියෙනවා. මෙවර අයවැය කතාව කියවනකොට අපිට මතක් වෙන්නේ මීට වසර 40 කට පෙර විවෘත ආර්ථිකය හඳුන්වා දුන් රොනී ද මෙල් මුදල් ඇමතිවරයා කියපු වචන ඒ ආකාරයටම උච්චාරණය කරන්න මංගල සමරවීර ඇමතිවරයාට සිද්ධ වෙලා තියෙනවා කියලයි. මේ ආර්ථික ක්‍රමය තවත් වසර 40 ක් මේ අයුරින්ම ඉදිරියට ගෙන ගියත් දියුණුවක් කරා යන්න බැහැ. අසාර්ථක ආර්ථික ක්‍රමයක් මත හැදුණු ආර්ථික ලියවිල්ලක් විතරයි මේ අයවැය. එයට රටේ ජනතාවට සාධාරණයක් ඉටු කරන්නට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

**අයවැය අධ්‍යාපනයට වෙන්කරන මුදල රටේ අධ්‍යාපනය සංවර්ධනයට ප්‍රමාණවත් ද?**

අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය වෙනුවෙන් කරලා තියෙන යෝජනාවල පදනම වන්නේ විවෘත ආර්ථිකයට ගැළපෙන තාලයට ශ්‍රමිකයෙක් බිහිකිරීමයි. 1939 අධ්‍යාපන ආඥා පනත වෙනස් කිරීමට යෝජනා කරනවා. කුණුකොල්ලයට ශ්‍රමය විකිණිය හැකි සහ මිල දී ගත හැකි ශ්‍රමිකයෙක් බිහිකරන අධ්‍යාපන ක්‍රමයක් ගෙන ඒම සඳහා තමයි ඔවුන් මෙවර අයවැයෙන් යෝජනා ඉදිරිපත් කරලා තියෙන්නේ. මෙහි විශේෂත්වය තමයි උසස් අධ්‍යාපනයේ තාක්ෂණික අංශය හා ශාස්ත්‍රීය අංශය අතර බරපතල අසමබරතාවයක් නිර්මාණය කරමින් යනවා. ඒ කියන්නේ තාක්ෂණික විෂයන්ට යම් පමණකින් හෝ මුදල් වෙන්කිරීමක් සිදුකර තිබුණත් ශාස්ත්‍රීය විෂයන් සම්පූර්ණයෙන්ම අමතක කරලා තියෙනවා. මේ උත්සාහ කරන්නේ අධ්‍යාපනයෙන් ශිෂ්ටසම්පන්න පුරවැසියෙක් නිර්මාණය කිරීම වෙනුවට හුදු ශ්‍රමිකයෙක් පමණක් නිර්මාණය කිරීමටයි.

> ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වන තරමට ජනතාව වෙනුවෙන් අවංකව වැඩකරන දේශපාලන ව්‍යාපාරයන්ට වාසිසහගත තත්ත්වයක් නිර්මාණය වෙනවා.

**පසුගිය අයවැයෙන් තරුණයන්ට සහන හා ප්‍රතිලාභ ලබාදෙනවා කිව්වත් ඒ කිසිවක් ලැබුණෙ නැහැ. ඒ ආකාරයටම මෙවරත් තරුණයින්ව රවටයිද?**

"නීලහරිත අයවැය හා Enterprise Sri Lanka, තේමාව යටතෙයි මෙවර අයවැය ඉදිරිපත් කොට ඇත්තේ. එහි ප්‍රධාන ඉලක්කයක් බවට ඔවුන් යෝජනා කරන්නේ තරුණයන් ව්‍යවසායකයන් බවට පත්කිරීමයි. නමුත් ඒ සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි යෝජනා අයවැය තුළ දක්නට ලැබෙන්නේ නැහැ. ඒ වෙනුවට හැමදාම කරනවා වගේ අමාත්‍යංශයට යම් මුදල් ප්‍රමාණයක් වෙන්කරන්න යෝජනා කරලා තියෙනවා. තරුණයන් සවිබල ගන්වනවා යැයි වචනවලින් ප්‍රකාශ කළද ප්‍රායෝගිකව එය දකින්න ලැබෙන්නෙ නැහැ. තවදුරටත් තරුණයන්ගේ සිහින බොඳකරන, රට අපේක්ෂාභංගත්වයට පත් කරන්නක් මිස සුභවාදී රටක්, තරුණයෙක් ගොඩනගන අයවැයක් ලෙස හිතන්න අමාරුයි.

**ව්‍යවස්ථා සංශෝධනය රටේ සාමයට හා ඒකීය බවට බලපෑම් ඇති කරයිද?**

අපේ රටේ පවතින ව්‍යවස්ථාව අවුරුදු 40 ක් පරණයි. එය විධායක ජනාධිපති ධුරය හා ගැටගැහුණු ඒකාධිපති, ප්‍රජාතන්ත්‍රවාදය සීමාකරන ලද ව්‍යවස්ථාවක්. මේ ව්‍යවස්ථාව හඳුන්වා දුන් තැන සිටම එය වෙනස් කළ යුතු යැයි දේශපාලන කථිකාවක් පැවතුණා. විශේෂයෙන්ම 1982 ජනාධිපතිවරණයේ සිට 2015 ජනාධිපතිවරණය දක්වා සියලුම ජනාධිපතිවරණ වේදිකාවල ප්‍රධාන සටන් පාඨයක් බවට එය පත්වුණා. 2015 දී එය ප්‍රධානතම සටන් පාඨයක් වුණා. ඒ නිසා තමයි මේ අවස්ථාව. විධායක ජනාධිපතිධුරය අහෝසිකර ගැනීම සඳහා. ඒ සඳහා ජනවරමක් ලැබිලා තියෙනවා. පසු ගිය අවුරුදු දෙකේදී පාර්ලිමේන්තුව නව ව්‍යවස්ථාවක් සකස් කරගැනීම සඳහා ක්‍රියාවලියක නිරත වුණා. අලුත් ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කරලා එය ජනතාවගේ කැමැත්ත අකමැත්ත විමසන්න ඉදිරිපත් කළ යුතුයි. නමුත් අලුත් ව්‍යවස්ථාවට එරෙහිව පැරණි ව්‍යවස්ථාව කරපින්නාගෙන යා යුතුයි කියලා හිතන, ඒ වගේම අමු ජාතිවාදී හා අන්තවාදීන් පිරිසක් තමන්ගේ ඊළඟ බල ව්‍යාපෘති සකස් කරගන්න හිතාගෙන ඊට විරුද්ධව අභූත චෝදනා නගමින් සිටිනවා. එසේම ඔවුන්ගේ යෝජනාවලට උත්තර බඳින්න ආණ්ඩුව ක්‍රියා කරන්නේ නැහැ. මේ චෝදනා පොළවේ පැළ වෙලා තියෙනවා. ඇත්තටම තවමත් ඒකීයභාවය අහෝසි කරන්න හෝ රටේ සමගිය විනාශ කරන්න හෝ රට බෙදන්න හෝ කිසිඳු ආකාරයේ ව්‍යවස්ථාවක් සකස් වෙලා නැහැ. දේශපාලන පක්ෂ තමන්ගේ මතයන් ඉදිරිපත් කරලා තියෙනවා. සාකච්ඡා කරලා තියෙනවා. කෙසේ නමුත් මේ ව්‍යවස්ථාව සකස් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන කිසිඳු දේශපාලන පක්ෂයක් රටේ ඒකීයභාවය අහෝසි කරන්නට හෝ රට බෙදන්නට හෝ යෝජනා කරන්නේ නැහැ. එවන් තත්ත්වයක් තුළ තමයි පරාජිත රාජපක්ෂ කණ්ඩායම එළියට බැහැලා අතිශය විකෘතිසහගත මතයක් රටපුරා පතුරවමින් යන්නේ. මේ රට ප්‍රජාතන්ත්‍රවාදීව ඉදිරියට යා යුතුයැයි සිතන කිසිවෙකු හෝ ඒ මතය සම්පූර්ණයෙන්ම බැහැර කළ යුතුයි. මේ ජාතිවාදී ක්‍රියාවට එරෙහිව තමන්ගේ මතය ඉදිරිපත් කළ යුතුයි. මොකද මේ වපුරන ජාතිවාදයේ අවසාන ගොදුර බවට පත්වෙන්නේ මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් තරුණ ප්‍රජාවයි.

**ව්‍යවස්ථා සංශෝධනය රටේ අභිවෘද්ධියට බලපාන්නේ කෙසේද?**

මේ හැදෙන්නට යන්නේ සමාජවාදී හෝ අතිශය ප්‍රගතිශීලී හෝ ව්‍යවස්ථාවක් නොවෙයි. මේ හදන්නෙත් ධනපති ව්‍යවස්ථාවක්ම තමයි. නමුත් මේ මොහොතේ මේ ව්‍යවස්ථාව හදන්නට මුල් වෙන ආණ්ඩුව ශක්තිමත් බලයක් තියෙන ආණ්ඩුවක් නෙමෙයි. මේක හවුල් ආණ්ඩුවක්. ඔවුන්ට තනි බලයක් නැහැ. මෙවැනි අවස්ථාවක මෙහි තිබෙන අර්බුදය පාවිච්චි කරලා ජනතාවට යම් ප්‍රතිසංස්කරණ ප්‍රමාණයක් දිනාදිය හැකියි සහ දිනාදිය යුතුයි. පක්ෂයක් ලෙස අපි මැදිහත් වෙන්නේ ඒ වෙනුවෙන්. ඒකෙ කිසි වරදක් නැහැ.

7 පිටුවට



# ජනතාවාදී සිනමාවේ නිහඬ හඬ චාලි චැප්ලින්

සිනමා කලාව ලොව පහළ වන්නට වසර කිහිපයකට කලින් මෙලොවට බිහි වී ලෝක සිනමාව දිග්විජය කළ නිර්මාණකරුවෙකු වේ නම් ඒ චාලි චැප්ලින්ය. ශරීර ප්‍රමාණයෙන් කුඩා මිනිසෙකු වුවද හෙතෙම තම ප්‍රහසන රංගන ප්‍රතිභාව ඔස්සේ මුළු ලොවම අමන්දානන්දයට පත් කළේය. 1889 වසරේ ලන්ඩනයේ දකුණු ප්‍රදේශයෙහි දී උපත ලද ඔහුව ඔහුගේ මව විසින් නම් කරනු ලැබුවේ "චැප්ලින් චාලිස් ස්පෙන්සර්" යනුවෙනි.

චාලි චැප්ලින් කියූ පමණින් මේ පෘථිවි තලයේ ඕනෑම සිනමා රසිකයෙකුට ආගන්තුකයකු විය නොහැකි අපූර්ව රංගධරයෙකු වීමට ඔහු සමත් විය. ඔහුගේ සෑම කලා නිර්මාණයකම යම් දේශපාලන අර්ථයක් ගැබ්වී තිබීම තුළින් ඔහු ජනතාවාදී කලාකරුවෙකු ලෙස හැඳින්වීම වඩාත් උචිත බව මගේ හැඟීමයි. දුගී ජනතාවගේ මිතුරෙක් වූ ඔහු සමාජයේ වරප්‍රසාද ලත් පංතිය ප්‍රහසන කලාවෙන් නිර්දය ලෙස විවේචනයට ලක් කිරීමට ද නොපසුබට විය.

මුළු සිනමාපටය පුරාම එකදු වදනක් හෝ නොදොඩා මුල සිට අග දක්වාම රසිකයා ග්‍රහණය කරගැනීමට ඔහු සමත් විය. එසේ වීමට සුවිශේෂී හේතුවක් තිබුණි. සිනමාව ලොවට බිහි වූ දහනව වන සියවසෙහි අග භාගයේදී එනම් චිත්‍රපට කලාවෙහි මුල් යුගයේදී නිපදවූ සෑම චිත්‍රපටයක්ම "නිහඬ" විය. චිත්‍රපට හඬ කැවීම පිළිබඳව එකල ශිල්පීන් දැන සිටියේ නැත. එහෙත් 1930 වර්ෂයේදී හඬ කවන ලද චිත්‍රපට බිහි වූ පසුවද චැප්ලින් තවදුරටත් තම රසිකයින්ගේ ඉල්ලීම් වෙනුවෙන් නිහඬ සිනමාපට නිපදවූයේය.

ඔහුගේ චිත්‍රපට තුළ ඔහු බොහෝවිට තමාගේම යැයි නිවසක් නොලද ඉබාගාතේ සැරිසරන පීඩිතයෙකුගේ චරිතය නිරූපණය කළේය. එවැනි මිනිසුන් සමාජයේ ප්‍රභූන් යැයි සලකන පංතියෙන් අවමානයට හා අපහාසයට ලක්වන අයුරු රසිකයාට පෙන්වූයේ සමාජයේ වැසී ගිය කඩතුරාවක් විවර කරමිනි. එමෙන්ම 1936 දී Modern Times නම් චිත්‍රපටය තුළින් ඔහු වික්‍රමාන්විත කම්කරුවකුගේ චරිතයට ජීවය දුන්නේ තම පංතිය සතු බලයට බමුණු කුලය පවා යට කළ හැකි බව ලොවට පෙන්වමිනි. හිට්ලර්ගේ ආඥාදායකත්වයට ලොව නතු වෙද්දී ඔහුට එරෙහිව තම නිර්මාණශීලීත්වයෙන් පහර දීමට තරම් චාලි චැප්ලින් නිර්භය මිනිසෙකු විය. ඔහු විසින් නිපදවනු ලැබූ බලසම්පන්න ආඥාදායකයා (Great Dictator-1940) නම් වූ චිත්‍රපටයෙන් හාස්‍යයට ලක් වූයේ ජර්මන් ආඥාදායක ඇඩොල්ෆ් හිට්ලර් සහ ඔහුගේ නාසිවාදී අනුගාමිකයින්ය. එය ලොව පුරා ප්‍රගතිශීලී ජනතාවගේ නොමඳ පැසසුමට ලක් වූ අද්විතීය සිනමා සිත්තමකි.

ඔහුගේ දේශපාලන දර්ශනය මාක්ස්වාදී විය. ඔහු ඇමරිකාවේ වාසය කළ කාලය තුළ බොහෝ වාමාංශික දේශපාලන පක්ෂ සමඟ සමීප සබඳතා පැවැත්වීය. එරට වර්ණභේදවාදයද දුගීන් හා ධනවතුන් අතර ඇති දැවැන්ත ආර්ථික විෂමතාවන් ගැනද ඔහු ප්‍රශ්න කරන්නට විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇමරිකානු රජය විසින් චැප්ලින්ව පිටුවහල් කරනු ලැබීය. ඔහුගේ චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමද තහනම් කෙරිණි.

එහෙත් 1972 වර්ෂයේදී ඔහු නැවත ඇමරිකාවට ගියේ දැවැන්ත ජයග්‍රහණයක් ලද සිනමාකරුවකු වශයෙනි. ඒ ඔස්කාර් (OSCAR) සම්මානයක් ලබාගැනීම සඳහායි. චලන චිත්‍රපට බිහිකරනු වස් ඔහු විසින් දැක්වූ අප්‍රතිහත උත්සාහය අගයනු පිණිස ඔහුට එම සම්මානය පිරිනැමුණි.

1977 දී එනම් වයස අවුරුදු අසූ අටේදී චාලි චැප්ලින් ලොව හැර ගියේ ඔහුගේ ශ්‍රී නාමය සදාකාලිකවම මෙදියතෙහි මුද්‍රාවක් තබමිනි. ඊට දෙවසරකට පෙරාතුව ඔහුව "සර් චාලි චැප්ලින්" ලෙසින් හැඳින්විණි. ඒ මානව වර්ගයා වෙනුවෙන් ඔහු කළ අසීමිත මෙහෙවරට ගෞරව කරනු පිණිසය.



# හිසක් නොමැතිව මාස 18ක් ජීවත් වූ කුකුළෙක්

නිකම්ම නිකං මයික් යනුවෙන් හැඳින්වූ කුකුළෙක් "මිරැකල් මයික්" නමින් ලොව පුරා ප්‍රසිද්ධියට පත් විය. ඒ ඌ සිය හිස නොමැතිව මාස 18ක් පුරා ජීවත් වීමේ ආශ්චර්යමත් සිදුවීම නිසායි.

වර්ෂ 1945 එක්තරා දිනක දී ඇමරිකාවේ කොලරාඩෝ ප්‍රාන්තයේ ගොවිපළක හිමිකරුවෙක් විසින් මයික්ගේ හිස කඳින් වෙන්කෙරිය. කුකුළෙකුගේ හිස කඳෙන් වෙන්කළ පසුත් ඌ ටික වේලාවක් ඒ මේ අත දිවීම සාමාන්‍යය. එහෙත් පසුදා පහන් වන විටත් මයික් ගොවිපළ පුරා සැරිසරනු දැක මවිතයට පත් වූ ගොවිපළ හිමිකරුවා මේ ගැන තම හිතවතුන්ට දැන්වීය. ආරංචිය පැතිරීමෙන් පසුව එක්තරා සර්කස්කරුවෙක් විසින් ඔහුව මුණගැසී මයික්ව තම කණ්ඩායමට බඳවා ගැනීමට අවසර ඉල්ලීය. එතැන් පටන් මාස 18ක් පුරා මයික් ඔවුන් සමඟ ලොව වටා සංචාරයට එක් විය.

කෙසේ වුවද මෙම අනතුරෙන් පසු මයික්ට ආහාර ලෙස ලබා දී ඇත්තේ දියර වර්ගයි. ඒවා කෙළින්ම ඌගේ ගලනාලයට ඇතුළු කර අනතුරුව සිරින්ජයක් මඟින් උගුර පිරිසිදු කර ඇත. එහෙත් මයික් මිය ගිය දා අතපසුවීමකින් සිරින්ජය සර්කස් බිමේ දමා විත් තිබූ අතර වෙනත් සිරින්ජයක් ගෙනෙන විටත් මයික් ජීවිතයෙන් සමුගෙන තිබුණි.

විද්‍යාඥයින් පවසන පරිදි කුකුළන්ගේ මොළය ඉතා කුඩාය. එහෙත් මයික්ගේ ගෙල කපන විට උගේ මොළයෙන් සෑහෙන කොටසක් ඇඟ කොටස සමඟ ඉතිරි වීම නිසා මොළයට අවම හානි වීමෙන් මෙලෙස ආශ්චර්යමත් ලෙස ජීවත් වීමට මයික්ට වරම් ලැබී තිබුණි.

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත

464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

Tel: 0112193721
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syulanka.com

# අපි අපිම වෙමු....

තරුණයින් සැමදෙනාගේම බලාපොරොත්තුව යහපත් හෙට දවසක් වගේම යහපත් අනාගතයක්. ඒක එහෙම වුනත් ඒ බලාපොරොත්තුව ඉටුකරගන්න පුළුවන් කීයෙන් කී දෙනාටද? අපි හැමෝම සමානයි කිව්වට කොල්ලො කෙල්ලො වෙච්ච අපිට ජොබ් එකක් සෙට්කරගන්න තියෙන අමාරුව අපි දන්නවනේ. සල්ලි තියෙන, බලය තියෙන උන් සල්ලියි බලයයි පාවිච්චි කරලා හොඳ හොඳ ජොබ්වලට යනවා. සුදුසුකම් අදාළම නෑ. කවුරු කොහොම මොන දේ කිව්වත් තරුණ අපි රාමුවකට කොටුවෙන්නෙ මොකටද? ඇත්තමයි, අපි ඔක්කොම හිතන මතන විදිය, කරන කියන දේවල් හරිම වෙනස්. ඒ වෙන මුකුත් නිසා නොවෙයි, අපේම කියලා ට්‍රෙන්ඩ් එකකට වැඩ කරන්න අපි කැමති හින්දයි.

කොල්ලො කෙල්ලො හැමවිටම අලුත් දේ සොයන අලුත් දේ දකින, නිර්මාණශීලී අයයි කියලා කිව්වත් අලුත් දෙයක් පටන් ගන්න, අලුත් වැඩකට අතගහන්න සල්ලි නැති අපි වගේ උන්ට බැහැ. ඒ වගේම කවුරු කොහොම කිව්වත් කසාදයක් බඳිනවා කියන්නේ ඊටත් අමාරු දෙයක්. අද කාලේ වෙඩින් එකක් ගන්නවා කියන්නේ මුළු සේසතම නැතිහංගස්ථාන වෙන දෙයක් බවට පත්වෙලා. ඉතින් ඇත්තටම අපි මුණ දෙන සිටුවේශන් එක ඕක නේද?

තරුණ අපිට විවිධ හැකියාවන්, දක්ෂතාවයන්, කුසලතාවයන් ඕනෑතරම් තියෙනවා. ඒ නිසා තරුණ කොල්ලො කෙල්ලො විදියට දෙපයින් නැගිටින්න පුළුවන් හරිම මාවත හොයාගන්න ඕනා. මොකද අපේ ගමන හරස් කරන බලවේග දහස් ගණනක් තියෙනවා. බැරිවුණු කඩයිම් ගැන කණගාටු වෙන්නේ මොකටද? වැරදුණ තැනින්ම ජීවිතේ ජයගන්න මිනිස්සු ඔය ඕනතරම් ඉන්නෙ. අපි මේ ඉන්න සිස්ටම් එකේ හරි වැරැද්ද තෝරගෙන සමාජය බෙදිලා ඉන්න සීමා මායිම් බිඳලා හැමෝම එකතු වුනොත් අපේම හෙට දවස වෙනුවෙන් මේ රටේ අනාගතය වෙනස් කරන්න අපිට පුළුවන්. සහතිකයි, අපේ හැකියාව අපිම තේරුම් ගත්තොත් ඒකට නිවැරදි දැක්මක් තියෙන, අවංකව වැඩකරන ටීම් එකක් එක්ක සෙට් වුනොත්, ඉලක්කයක් තියාගෙන වැඩ කළොත් ජයග්‍රහණය වැඩිදුර නෑ. හෙට දවසෙදි හොඳ පුරවැසියො විදියට, අපි කැමති විදිහට අපේම ගමනක් යන්න, ජීවිතය දිනන්න පුළුවන් මාවත හෙළිපෙහෙළි කරන්න ඇත්තටම පුළුවන්. අන්න එතකොට නම් අපිටම කියලා වටිනාකමක් හැදෙනවා. එතැන නේද අනාගතය තියෙන්නේ? අන්න ඒ අනන්‍යතාවයට පාර කියන්න අපි සූදානම්.. එන්න අපත් සමඟ...

## නොවැම්බර් 07

හාල්මැස්සන් කිලෝවක් සඳහා රු. 12ක් ද පරිප්පු කිලෝවක් සඳහා රු. 10ක් ද සීනි කිලෝවක් සඳහා රු. 10ක් ද බැගින් බදු සහන ලබාදෙමින් ජනතාවගේ බඩු මිල අඩු කරන බව අයවැයට පෙරාතුවම ආණ්ඩුව නිවේදනය කළේය. මෙකී පුවත පිළිබඳ බොහෝ අදහස් fb පිටු තුළ සඳහන්ව තිබුණි. මෙයින් ජනතාවට දැනෙන සහනයක් නොමැත. ඒ සාමාන්‍ය පවුලක් තම පරිභෝජනය සඳහා එකවර මිලදී ගන්නේ හාල්මැස්සන් 100 ක් හෝ පරිප්පු 250 ක් වැනි ප්‍රමාණයක් වන නිසායි. ආණ්ඩුව මෙවර අයවැයෙන් ඇඟ බේරාගැනීමට හදන්නේ එලෙසය. එය ද කල් ඇතිව කීමට නොහැකි වුවානම් අයවැය තුළ පවා පෙනී නොපෙනී යන්නට තිබුණි. ආණ්ඩුව උත්සාහ ගෙන තිබුණේ "නීල හරිත" වචන හරයෙන් UNP - ශ්‍රීලනිප හවුල් ආණ්ඩුවේ 03 වන අය - වැය පරිසර හිතකාමී අය - වැයක් යැයි පෙන්වීමටය. ඒ හරහා සාමාන්‍ය ජනයා භාවිතා කරන යතුරුපැදියේ සිට ත්‍රීරෝද රථය දක්වාම කාබන් බද්දක් නමින් අලුත් බද්දක් එකතු කොට තිබුණි. ආණ්ඩුවේ "නීල හරිත" කෙබරය එයින්ම ජනතාවට නිතර මතකයට නගා දෙනු ඇත. ජනතාවට බදු පිට බදු පටවමින් රටක් ලෙස තවදුරටත් ණය බරෙහි ගිල්වීම හැර තවදුරටත් ජනතාව වෙනුවෙන් අලුතින් සහනයක් ගෙන ඒමට මංගලගේ මංගල අයවැයට නොහැකි විය. ආණ්ඩුවේ නාස්තිකාර වියදම් හමුවේ එය තවදුරටත් සුපුරුදු ලෙසම පිළුණු වූ අයවැයක් විනා අන් යමක් නොවීය.

## නොවැම්බර් 09

''පෙට්‍රල් අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න.'' මෙය ආණ්ඩුවේ නිවේදනය විය. ඊට ප්‍රතිචාර ලෙස ''යකෝ උඹලා හිතුවෙ අපි පෙට්‍රල් මූණ හෝදන්න, පස්ස හෝදන්න පාවිච්චි කරනවා කියලද? '' යනුවෙන් පළ වූ පෝස්ට් එකක් FB පිටු අතර හුවමාරු වෙමින් තිබුණි. කෙසේ වුවද බලයට පත්වීමට



ප්‍රථමයෙන් එජාපය පවා පුරසාරම් දෙඩවූයේ කළමනාකරණයේ ඉහළම හැකියාව ඇත්තේ ඔවුන්ටය යනුවෙනි. එසේම එම හවුල්කාර පාර්ශව විසින් අර්බුදයට පත් රටට පිළියම් ඇත්තේ තමන් සතුව යැයි පුනපුනා පැවසූ නමුදු යථාර්ථය එය නොවේ. රටට පැමිණි එක් තෙල් නැවක් ආපසු හැරවීමෙන් දින දෙකක් තුළ රටම අකර්මන්‍ය වීමට වුයේ එහෙම පාලනයක් තුළදීය. රජය සතුව ඕනෑතරම් ගබඩා පහසුකම් තිබියදීත් මෙවැනි ඉන්ධන අර්බුදයක් නිර්මාණය කළේ අන් කරුණක් නිසා නොව ආණ්ඩුව සතුව නිවැරදි කළමනාකරණයක් නොමැති බව හා සැලසුමක් නොමැතිකම නිසාවෙනි. LTTE යුධ සමයේ දී ඔරුගොඩවත්ත තෙල්ගබඩා සංකීර්ණයට ප්‍රහාර එල්ල වුවද අඩාල නොවූ තෙල් සැපයුම එක් තෙල් නැවක් නොමැති වීමෙන් අර්බුදයට යාම ඉහත කී නොහැකියාවේ ප්‍රතිඵල බව මොනවට පැහැදිලිය.

## නොවැම්බර් 18

බැඳුම්කර වංචාවට සම්බන්ධ අර්ජුන් ඇලෝසියස් සමඟ දුරකථන සම්බන්ධතා පැවැත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් හෙළිකර ගැනීමත් සමඟ ඇතිවූ තත්වය විසින් බොහෝ පිරිසක් ඒ පිළිබඳ තම අදහස් FB පිටු අතරට එක්කර තිබුණි. විශේෂයෙන් මහ බැංකු වංචාව සම්බන්ධයෙන් කෝප්



කමිටුව විසින් විමර්ශනය කරන අතරතුර දී එනම් 2016.05.06 සිට 2016.10.28 දක්වා වන කාලය තුළ කෝප් කමිටුවේ මන්ත්‍රීවරුන් වෙත ලැබුණු හා ලබාගත් දුරකථන ඇමතුම් පිළිබඳ විස්තර වාර්තාවක් පසුගිය දාක පාර්ලිමේන්තුවට ඉදිරිපත් විය. ඒත් සමඟම එජාපයේ හා ශ්‍රීලනිපයේ මන්ත්‍රීවරුන් සමඟ අර්ජුන් ඇලෝසියස් පැවැත් වූ සම්බන්ධය පැහැදිලිවම හෙළිදරව් වී ඇත. මෙම චෝදනාවෙන් ගැලවීමේ අසාර්ථක උත්සාහයක ඔවුන් නිරතව සිටී. අමාත්‍ය සුජීව සේනසිංහ විසින් තමන්ට එල්ල වී ඇති චෝදනාවෙන් නිදහස් වීම සඳහා ගෙනහැර පෑ කරුණ වූයේ තමන් විසින් රචිත "මහබැංකු බැඳුම්කරයේ ඇත්ත නැත්ත" කෘතියට අදාළ තොරතුරු ලබාග ැනීමට එසේ සිදුකළ බවයි. එහෙත් සැබෑ ලෙසම එය මුද්‍රණය කර තිබුණේ 2015 ජූලි 27 වන දින හෝ ඊට ආසන්න දිනකදී ය.එනම් මෙම දුරකතන සංවාදවලට පෙරය. එහෙයින් සුජීව සේනසිංහ වැනිවුන්ගේ නිරුවත ජනතාව ඉදිරියේ හෙළිදරව් වීම නොවැළැක්විය හැකිය.

## නොවැම්බර් 19

ජාතිවාදයට එරෙහිව කවදත් කටයුතු කරන ජනතා විමුක්ති පෙරමුණ පසුගිය දා ගාල්ල ගිංතොට ප්‍රදේශයේ ඇතිවූ ගැටුම්කාරී තත්වයත් සමඟ එය සමථයකට පත්කිරීම සඳහා මැදිහත් විය. එම ප්‍රදේශයට ගිය ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාත් ගාල්ල දිස්ත්‍රික් නායක නලින් හේවගේ සහෝදරයාත් ඇතුළු පිරිස ප්‍රදේශයේ සිංහල, මුස්ලිම්, දෙපිරිසම මුණගැසුණු අයුරු Facebook



එකේ දක්නට විය. ඉතිහාසයේ මෙන්ම මෙම ගැටුම්කාරී සිදුවීම පසුපස ද ප්‍රදේශයේ ධනපති දේශපාලඥයෙකු ඇති අතර සිදුවීමෙන් පසු ඔහු පලාගොස් සැඟවී ඇත. එසේම එළඹෙන මැතිවරණය ඉදිරියේ තම දේශපාලන වාසි වෙනුවෙන් තරුණයින් දෙපිරිසක් අතර ඇතිවූ බහින්බස් වීමක් විශාල ගැටුමක් දක්වා රැගෙන යාමට ඔහු මුල් වූ බව තතු දන්නා කවුරුත් පවසා සිටී. ධනපති දේශපාලනය තම පැවැත්ම වෙනුවෙන් ඕනෑම සිදුවීමක් යොදාගන්නා අතර මෙයින් හැමදාමත් පීඩාවට ලක්වූයේ රටේ සාමාන්‍ය පුරවැසියාය. එබැවින් කළ යුතුව ඇත්තේ ජාතිවාදී උගුල්වල නොවැටී මෙකී තත්වය තේරුම් ගෙන සිංහල, දෙමළ, මුස්ලිම් අප කවුරුත් සහෝදරත්වයෙන් කටයුතු කිරීමයි.

## නොවැම්බර් 22

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණය කල්දමා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් දරන නිර්ලජ්ජිත උත්සාහයේ එක් සිදුවීමක් වූ අධිකරණ වාරණ නියෝගයක් ලබාගැනීමේ ඡන්ද පෙත්සම විභාග වීමත් සමඟ ඒ පිළිබඳ විස්තර වාර්තාවලින් FB පිටු පිරී ගියේය. ජනතාවට ලබාදුන් පොරොන්දු ඉටුනොකළ නිසාවෙන්ම ජනතාව ඉදිරියට යාමට බියවී සිටින ආණ්ඩුව, විශේෂයෙන්ම එහි ශ්‍රීලනිපයේ මෛත්‍රී ප්‍රමුඛ කණ්ඩායම මැතිවරණය කල්දමා ගැනීමට දරන ලද උත්සාහය අද වනවිට රට හමුවේ හෙළිදරව් වී ඇත. මෙකී පෙත්සම ඉදිරිපත් කරන ලද පිරිස් පැහැදිලිවම ශ්‍රීලනිපයේ ආධාරකරුවන් බවත් මේ සඳහා සැලසුම් සකස් කරන ලද්දේ ෆයිසර් මුස්තාෆා ඇමතිවරයා බවත් අද වන විට හෙළිදරව් වී හමාරය. ශ්‍රීලනිපයේ සිදුව ඇති බෙදීම හා ජනතාවට ලබාදුන් පොරොන්දු ඉටුනොකිරීම නිසා අද වන විට ජනතාවගෙන් ප්‍රතික්ෂේප වී ඇති ශ්‍රීලනිපයටත් එජාපයටත් ජනතාව හමුවට ගොස් කීමට යමක් ඉතිරි වී නොමැත.

පසුගිය දවසක මගෙන් වෛද්‍ය උපදෙස් ලබාගැනීමට තරුණයෙක් පැමිණියා. ඔහු උසස් පෙළ හැදෑරූ අයෙක්. ටික කලකට පෙර ඔහු විවාහක කාන්තාවක් සමඟ අනාරක්ෂිත ලිංගික ඇසුරක් පවත්වාගෙන ගොස් තිබුණා. පසුව ඔහුගේ ලිංගික ප්‍රදේශවල කැසීමක් හා රතුවීමක් ඇතිවී තිබුණා. ඔහුගේ පෙම්වතියට මෙය කීමට ඔහු බිය වුණා. අධික ලෙස බිය, සැකය හා කනස්සල්ල සමඟ පැමිණි ඔහුට විශාදය සමඟ කාංසාව යන මානසික රෝග වැළඳී තිබුණා. වරක් ඔහු ගෙල වැළලාගෙන සියදිවි හානිකර ගැනීමටත් උත්සාහ කර තිබුණා. මෙම මානසික රෝග තත්වයට හේතු වුනේ ඔහුට ඇති වී තිබුණු ලිංගික අවයවවල රෝගී තත්වයයි. ඔහු වරක් දෙවරක් නොව කීපවරක්ම විවිධ ලිංගාශ්‍රිත රෝග සායනවලට ගොස් පරීක්ෂා කරවාගෙන තිබුණා. පරීක්ෂණවලින්ද කියවී තිබුණේ ඔහුට ලිංගාශ්‍රිතව බෝවන රෝගයක් නොමැති බවයි. නමුත් ඔහුගේ ලිංගික අධ්‍යාපනයේ ඇති දුර්වලතාව නිසා අවසානයේදී ඔහුට මානසික රෝගියෙක් ලෙස ප්‍රතිකාර ගැනීමටත් සිදු වුණා. මෙය සත්‍ය කතාවක්. මෙයට හේතුව වන්නේ ලිංගිකත්වය රහසක් ලෙස සලකන සංස්කෘතියක් ඇති ලංකාව වැනි රටක ලිංගික අධ්‍යාපනය නිසියාකාරව ලබා නොදීමයි.

# ලිංගාශ්‍රිත රෝග පිළිබඳව ඔබ දැනුවත් ද?



වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි

**ලිංගික අධ්‍යාපනය පිළිබඳ ලිපි පෙළේ අද කතා කරන්නේ ලිංගාශ්‍රිත රෝග ගැනයි. වෛද්‍යතුමනි, ලිංගික අවයවවල හා ඒ ආශ්‍රිතව හටගන්නා රෝගී තත්වයන් සියල්ල ලිංගික රෝග, එනම් කලකට ඉහතදී කියූ සමාජ රෝග ගණයට අයත් වෙනවා ද ?**

ලංකාවේ ලිංගික අධ්‍යාපනයේ දුර්වලතාව නිසාම වත්මන් තරුණ පරපුර මුහුණ දෙන එක ප්‍රශ්නයක් තමයි මෙය. ලිංගික ප්‍රදේශවල ඇතිවන සියලුම රෝගී තත්වයන් ලිංගාශ්‍රිතව බෝවන රෝග වන්නේ නෑ. අනාරක්ෂිතව ලිංගිකව එක්වීමේදී තමයි ප්‍රධාන ලෙසම මෙම ලිංගාශ්‍රිත රෝග ඇතිවන්නේ. ලිංගික අවයව ආශ්‍රිතව නමුත් මෙම රෝගවලට අයත් නොවන රෝගී තත්වයන් රාශියක් තිබෙනවා. ඒවා ඇති වීමට ලිංගික කටයුතුවල යෙදීම අනිවාර්ය නෑ. එම රෝග ඉතාම සුලභයි. නමුත් ඒ පිළිබඳව දැනුවත් නෑ. මෙවැනි රෝග නිසා බොහෝ දෙනෙක් පීඩාවට පත්වෙලා තියෙනවා.

**ලිංගික ප්‍රදේශවල ඇති වන ලිංගාශ්‍රිත රෝග ලෙස නොසැලකෙන එවැනි රෝග මොනවා ද ?**

දිලීර රෝග, ආසාත්මිකතා, බැක්ටීරියල් වැජිනෝසිස් (bacterial vaginosis), සෙබේසියස් සිස්ට් (sebaceous cyst) යනු ඊට උදාහරණ කීපයකි. මේ පිළිබඳ ඉදිරි ලිපිවලදී කතා කරමු.

**ලිංගාශ්‍රිත රෝග යනු මොනවා ද ?**

ලිංගාශ්‍රිත රෝග ගණනාවක් සොයාගෙන තිබෙනවා. එයින් ලංකාවේ බහුලතම රෝගී තත්ත්ව කීපයක් තිබෙනවා. ලිංගික හර්පීස්, උපදංශය, ගොනෝරියාව, ගොනෝරියා නොවන මුත්‍රා ප්‍රදාහය, ට්‍රයිකොමොනයසිස් හා ලිංගික ඉන්නන් එලෙස බහුලව හමුවන රෝග තත්වයන් වේ. මෙයින් ලිංගික හර්පීස් හා ලිංගික ඉන්නන් ලංකාවේ සුලභවම හමුවන රෝග වේ.

**මෙම රෝග ඇති වන්නේ කොහොම ද ?**

අනාරක්ෂිතව ලිංගික එකතු වීමකදී එනම්, තම විශ්වාසවන්ත සහකරු හෝ සහකාරිය හැරුණු විට වෙනත් අයෙක් සමඟ කොන්ඩම් වැනි ආරක්ෂිත ක්‍රමයක් හෝ භාවිතා නොකරමින් ලිංගිකව එක්වීමකදී මෙම රෝග ඇතිවීමට ඉඩකඩ වැඩිය. විශේෂයෙන්ම ලිංගික සේවා සපයන්නියන් සමඟ එලෙස එකතු වීමකදී අවදානම ඉතා වැඩිය. ඊට අමතරව කලාතුරකින් රුධිරය හරහා කෙළින්ම සම්ප්‍රේෂණය වන්නටද පුළුවන්. උදාහරණයක් ලෙස ඉතාම කලාතුරකින් රුධිර පාරවිලයනයකදී එසේ විය හැක. ඒ හැරුණු විට ආසාධිත මවගෙන් දරුවාට උපතේදී හෝ මව්කිරි දීමේදී හෝ බෝවන්න පුළුවන් .



ආසාදිතයෙකු සමඟ මුඛ සංසර්ගය, මුඛ චුම්බනය වැනි අනාරක්ෂිතව කරන කටයුතු නිසා ද කලාතුරකින් මෙම ලිංගික රෝග බෝවන්න පුළුවන්. වඩාත්ම වැදගත් වන්නේ විශ්වාසවන්ත එක් සහකරුවෙක් හෝ සහකාරියක් සමඟ පමණක් ලිංගික කටයුතුවල යෙදීමයි.

**ලිංගාශ්‍රිත රෝග වැළඳුනොත් සුවකරන්නම බැරිද ? ජීවිත කාලය පුරාවටම තිබෙනවා ද ? මේවා මාරාන්තික රෝග ද ?**

හර්පීස් හා ලිංගික ඉන්නන් යන රෝග ඇති වන්නේ වෛරස් මඟිනි. ඒවා නිට්ටාවටම සුව කිරීම අපහසු වේ. ඒවායේ රෝග ලක්ෂණ ඖෂධ මඟින් පාලනය කිරීම කළ හැකි අතර පසුකාලයකදී නැවත මතුවීමට ඉඩකඩ බොහෝ වැඩිය. කණගාටුවට කරුණක් වන්නේ ලංකාවේ බහුලවම දකින්න ලැබෙන්නේ මෙම රෝග තත්වයන් වීමයි. නමුත් බැක්ටීරියා මඟින් බෝවන ගොනෝරියා හා ගොනෝරියා නොවන මුත්‍රා ප්‍රදාහ යන රෝගත් පරපෝෂීන් මඟින් බෝවන ට්‍රයිබයිකොමොනයසිස් රෝගයත් සුව කිරීමට ඇති ඉඩකඩ වැඩිය. අනිවාර්යයෙන්ම මේ සියලු රෝගවලට නිසි කාලයේදී නිසියාකාර වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර ලබාගත යුතු වෙනවා. එලෙස ලබා ගතහොත් රෝගය වැඩි වීම පාලනය කරනවාට අමතරව සංකූලතාවන්, එනම් වඳභාවය, ලිංගික අවයව ඇලී යාම් ආදියෙන් මිදීමටද හැකි වෙනවා. මේවා මාරාන්තික රෝග ලෙස සලකන්නේ නැහැ.

**ඒඩ්ස් / HIV කියන්නේ ලිංගික රෝගයක් නේද? එය මාරාන්තික රෝග යක් නේද ?**

ඔව්. එය වෛරස් රෝගයක්. ලංකාවේත් මේ වන විට සැලකිය යුතු තරම් පිරිසකට මෙම රෝගය අසාදනය වෙලා තිබෙනවා. අපි ඒ පිළිබඳව ඉදිරි ලිපි තුළින් කතා කරමු.

ජීවිතයේ එක්වරක් හෝ අනාරක්ෂිත ලිංගික ක්‍රියාවක යෙදී තිබේ නම් ලිංගික රෝගයක් වැළඳෙන්න පුළුවන් ද? ලිංගික රෝගයක් වැළඳුනහොත් දැනගන්නේ කොහොමද? කාටද කියන්නේ? පරීක්ෂා කරගන්නේ කොහොමද? මොකක්ද කරන්න ඕන....?


අපි ඊළඟ ලිපියෙන් ඒ පිළිබඳව දැනුවත් වෙමු.

සටහන: වෛද්‍ය රිසිනි විල්මා









# කන්න දේ රැස්කරයි කූඹියෝ



"මිනිස්සු අනාථ වෙලා ඉන්නේ බං. උන්ට ඕනෙ එල්ලෙන්න මොකක් හරි. ටික වෙලාවකට හරි උන්ගෙ හිත පොඩි ආතල් එකකට අරගෙන යන මොනවමහරි දෙයක්. ක්‍රිකට් මැච් එකක් වගේ. එහෙමත් නැත්නම් ඡන්දයක් වගේ. අඩුම තරමෙ ගමේ කාගෙ හරි වලියක් වගේ එකක්. උන්ගෙ ප්‍රශ්න ටික වෙලාවකට හරි අමතක වෙන මොකක්මහරි මඟුලක්.''

"අප්පද බොල යකඩෝ..!" එතකොට අපි මේකත් විකුණනව ද?"

"නැත්තන් "

"හප්පේ! අයියා තමයි අයියෙ දවසකටවත් මිනිහා. එක වැඩකට කෙළවෙලා රස්නෙවත් යන්න හම්බුණාද? අම්මේ.... ගල් ඉබ්බා!"

ඒ ජෙහාන් හා ප්‍රියන්තය. අධිප්‍රවේගකාරී සමාජ වටපිටාවක් තුළ තම ජීවන යන්ත්‍රය පණානැංවීමට වෙර දරන අපේම කාලයේ තරුණයන් දෙදෙනෙකි.

ජෙහාන් රැකියා විරහිත උපාධිධාරියෙකි. එසේම සැබෑම දක්ෂයෙකි. නමුත් දක්ෂකමට නිසි තැන නොහී, ජෙහාන් නගරයේ ජීවත් වෙමින් ඔහුගේම ව්‍යාපාර කිහිපයක නිරත වෙමින් සිටී. ප්‍රියන්ත ද රැකියාවක් අපේක්ෂාවෙන් නගරයට පැමිණේ. ඔවුන්ගේ හමුවීම සිදුවන්නේ මේ අතරතුරදීය. ජෙහාන් සිය ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රියන්තව හවුල් කරගන්නේ තවත් ව්‍යාපාර හිමියෙකුට සේවකයෙකු ලෙස නොවේ. ඔවුන් අතර මිත්‍රත්වය, සුහද බව හා විශ්වාසය පිරි සහෝදරත්වයක් ගොඩනැගෙන්නේ බැඳීම් ගිලිහෙන, මුදල් ඉස්මතු වන සමාජයක මානව බැඳීම්වල අගය මනාවට පසක් කරමිනි. එබැවින් ජෙහාන් හා ප්‍රියන්ත අපට හමුවන "කූඹියෝ" රසික හදවත් වඩ වඩාත් ආමන්ත්‍රණය කරමින් සිටී.

"අයියෙ, ඇත්තටම අපි මේ කරන්නෙ හොරකමක් නේද?"

"හරි, දැන් ඔය බඩු සුපර් මාකට් එකට එන්නෙ කොහෙන්ද? ඔය බඩු සුපර් මාකට් එකට එන්නෙත් අනිත් කඩවලට එන වාහනෙන්මයි. සුපර් මාකට් එකේ තියෙන එළවළු හැදෙන්නෙත් පොළේ තියෙන එළවළු හැදෙන කොටුවෙමයි, ඒ ගහේමයි. ඉතින් මොකක්ද වෙනස?"

"එහෙනම් ඉතින් මිනිස්සු මොකටද සුපර් මාකට් යන්නෙ?''

"ඒක වෙනම ආතල් එකක් බං!"

චරිත කිහිපයක් වටා ගෙතෙන මෙම ටෙලිවෘතාන්තය විසින් සමාජය තුළ නිරතුරුව ගැටෙන සිද්ධීන් විනිවිද යමින් කුතුහලය, ත්‍රාසය හා උපහාසය මුසුකොට ඉතා ස්වභාවික ආකාරයෙන් අප හමුවේ තබයි. දක්ෂ නිර්මාණයක් වන මෙය ලක්මාල් ධර්මරත්නයන්ගේ අධ්‍යක්ෂණයක් වන අතර නිෂ්පාදනය අසංක දොඩම්තැන්න විසිනි.

සාර්ථක කලා නිර්මාණයක් වනාහී සමාජය තුළ රස මෙන්ම ගුණ ද වගාකළ යුත්තකි. කූඹියෝ ද අද සමාජයේ යථාර්ථය ගෙනහැර පෑමට යම් ප්‍රයත්නයක නිරතව සිටී. එබැවින් සාර්ථක කලා නිර්මාණයක් ලෙස සුවහසක් ප්‍රේක්ෂක සිත්සතන් තුළ යහපත් පණිවුඩයක් තබා යන්නට කූඹියන්ට හැකි වේ යැයි අප ද බලා සිටින්නෙමු!

## මෙවර අයවැයෙන්...

03 පිටුවෙන්

ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වන තරමට ජනතාව වෙනුවෙන් අවංකව වැඩකරන දේශපාලන ව්‍යාපාරයන්ට වාසිසහගත තත්ත්වයක් නිර්මාණය වෙනවා. ඒ නිසා අපේ මැදිහත් වීම තියෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය තව පියවරක් හෝ ඉදිරියට ගන්න පුළුවන් ව්‍යවස්ථාවක් වෙනුවෙන් පෙනීසිටීමටයි.

**කෝප් කමිටුවේ සාමාජිකයින් 05 දෙනෙක්ම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් චෝදනා එල්ල වන ප්‍රධානතම චූදිතයෙක් සමඟ දුරකථන සබඳතා පවත්වා තියෙනවා. ඒ සම්බන්ධව හෙළිදරව් වුනත් මෙතෙක් නීතිය ක්‍රියාත්මක වී  නැහැ. ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙයි කියලා විශ්වාසයක් තියෙනවද?**

එක්සත් ජාතික පක්ෂයේ 04 දෙනෙක් සහ ශ්‍රිලනිපයේ අයෙක් කෝප් කමිටුවේ බැඳුම්කර විමර්ශනය සිදුවෙද්දී එහි ප්‍රධාන චූදිතයෙක් වන ඇලෝසියස් සමඟ දුරකථන ඇමතුම් සියගණනකින් සම්බන්ධ වෙලා තියනවා. ඒ අනුව පෙනෙනවා කෝප් කමිටුවේ වාර්තාව තමන්ගේ උවමනාව පරිදි වෙනස් කරගැනීමට ඇලෝසියස් යම් ආකාරයක උත්සාහයක යෙදිලා තියෙන බව. ජනතා ඡන්දයෙන් පාර්ලිමේන්තුවට පත්වුණු මේ මන්ත්‍රීවරු දිගින් දිගටම ඔහුත් සමඟ කතා කරමින් බැඳුම්කර වංචා විමර්ශනය සම්බන්ධයෙන් තොරතුරු සපයලා තියෙනවා. එය බරපතල වරදක්. ඒ නිසා වංචනිකයින්ට දඬුවම් ලබාදෙන විට මේ සිදුවීම් පෙළද සැලකිල්ලට ගත යුතුයි. කෙසේවෙතත් මේ රටේ මහජන දේපළ වංචා කළ කිසිවෙකුට හෝ මේ තාක් දඬුවම් හිමිවෙලා නෑ. යම්කිසි ආකාරයකට අධිකරණයෙන් දඬුවම් පැමිණවුව ඔවුන් ඇප මත නිදහස් වෙලා තියෙනවා. රාජපක්ෂ ආණ්ඩුවේ හොරුන්ට දඬුවම් නොකළ මේ ආණ්ඩුව තමන් විසින්ම හොරකම් කරන ලද දේ සඳහා දඬුවම් කරයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. රටේ හොරකම්වලට එරෙහි ප්‍රබල ජනමතයක් සහ ජනබලයක් මඟින් විතරයි මෙවැනි හොරුන්ට දඬුවම් ලැබෙන්නේ.

**මෙවර මැතිවරණය මුළු රටටම සුවිශේෂීයි. එහි තරුණයාගේ කාර්යයභාරය කෙබඳුද?**

මෙය අන්ත, දූෂිත, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයක් අවුරුදු 10 ක් තිස්සේ පැවතිලා යම්කිසි ආකාරයක ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ කීපයක් ක්‍රියාත්මක වන වටපිටාවක ක්‍රියාත්මක වන මැතිවරණයක්. නමුත් මේ මැතිවරණයේදීත් තමන්ගේ දේශපාලන බල අරගලය නිසා ජනතා කැමැත්ත කුමන්ත්‍රණකාරීව යටකරලා තියෙනවා. අපේ උත්සාහය තිබෙන්නේ එකවර රටපුරා පවත්වන මැතිවරණයක් හරහා ගමේ ජනතාවට තමන්ගේ නියෝජිතයන් පත්කරගැනීමට අවස්ථාව දීමයි. මේ වෙලාවේ තරුණයින්ගේ කාර්යයභාරය අතිශය වැදගත් සහ තීරණාත්මකයි. දැන් 1947 න් පසුව අපේ රට ප්‍රධාන පක්ෂ දෙකක් විසින් මාරුවෙන් මාරුවට අවුරුදු 70 ක් තිස්සේ පාලනය කරලා තියෙනවා. ඒ වගේම ඒ කාලය තුළ පරම්පරා දෙකක නායකයෝ බලයේ හිටියා. ඒ අය, ඒ පක්ෂ ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්ති රටේ ගෙන ගිය අයුරු අපේ ඇස් පනාපිටම දැක්කා. ඒ නිසා දැන් වෙනසක් උවමනා කරලා තියනවා.

අලුත් විදියට හිතන, මේ රටට ආදරය කරන, ජනතාවට වගකියන නව පාලනයක් බිහිවිය යුතුමයි. ඒ සඳහා මූලිකත්වය ගතයුත්තේ තරුණයායි. ඔවුන්ට ඉතිහාසය කියවිය හැකි නිසා, ඔවුන්ට අනාගතය දැකිය හැකි නිසා මේ වර්තමානයේ තාරුණ්‍යයන් විසින් කරන මැදිහත්වීම තුළ අපට යහපත් අනාගතයක් පිළිබඳ අපේක්ෂා තබාගන්න පුළුවන්. ඒ නිසා මම ආරාධනා කරනවා, ඔබේ වගකීම තේරුම් ගන්න කියලා. ලෝකය වේගයෙන් අපිව පහු කරලා ඉදිරියට ගිහින් තියෙන්නේ. නවීන තාක්ෂණයෙන් විද්‍යාව බොහෝ දේ අත්පත් කරගෙන තියෙනවා. ඒත් ඒවා උපයෝගී කරගෙන අපේ තරුණයන්ට ශක්තිමත් සමාජ ආර්ථික ක්‍රමයක් ගොඩනගලා දීලා නැහැ. අපි හැමදෙනාම එකතු වෙලා මේ රටේ ශක්තිමත් ආර්ථික පදනමක් හා ඒ මත ගොඩනැගෙන සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය හා සමගිය පිරි රටක් නිර්මාණය කළ යුතුයි. ලෝකයත් එක්ක අපේ රටට ගමන් කරන්න පුළුවන් විදියේ ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැගිය හැකි අලුත් බලයක් අපි අපේ රටේ හදමු. අලුත් පාලනයක් හදමු. එය මේ රටේ තරුණ්‍යයේ වගකීමයි.

## සරදියෙල්ගේ කොලම

ගංවතුර වෙලාවේ, වේල් ගාණක් තිස්සේ කාලා නැතුව හීතලේ ගැහි ගැහී හිටපු කඩුවෙල ජනතාවට, කෙසෙල් ගෙඩිය ගානේ බෙදපු සුජීව මතක ඇතිනේ. ඇත්තටම ඒක දැකපු වෙලේ සරදියෙල්ට හිතුනෙම සුජීවව කෙසෙල් කරුවක නග්ගලා කැළණි ගඟ දිගේ මුහුදට යාත්‍රා කරවන්න. දැන්නම් සරදියෙල්ට විතරක් නෙවෙයි, මුළු ලංකාවෙම ඉන්න සරදියෙල් වගේ කොල්ලන්ට හිතිලා ඇති සුජීවව සල්ලං කරලා දාන්න. සල්ලිවලට යට නොවෙන හඳුන්නෙත්ති වගේ සභාපතිවරයෙක් යටතේ කෝප් කමිටුවේ වාඩිවෙලා ඉන්න ගමනත් මේ සුජියා හොරුත් එක්ක ඩීල් දාලානේ.

මහ සභාව මැද්දේ වැඩේ අතේ මාට්ටු වෙද්දි, මේකට උන්හිටි තැන් මතක නැතිව ගියා. "මං කෝල් ගත්තෙ "ඇත්ත - නැත්ත" පොත ලියන්නනේ." ඕං අතේ පැළ වෙන බොරුවක් කියලා, ඇඳගෙන හිටපු ජාතික ඇඳුමෙන්ම ඔලුව වහගත්තා. ඇනගත්ත ඇනගැනිල්ලේ තරම කියන්නේ, මෙයාට අමතක වුණා දැන් හෙළුව එළියෙ කියලා. 2015 තමයි මෙයා පොත එළිදක්වලා තියෙන්නේ. 2016 තමයි පොත ලියන්න තොරතුරු රැස්කරලා තියෙන්නේ.

කොහොම වුණත් ෆුට් නෝට් කල්ලියේ මෝඩ මොළවලට හිතෙන්නෙ නැතුව ඇති සරදියෙල් වගේ කොල්ලො කෙල්ලො මේ රටේ ආයෙ බිහිවෙයි කියලා. අපේ රටේ කොල්ලො කෙල්ලො මුංගෙ බින්න විශ්වාස කරපු කාලේ අහවරයි. ඒක ඩිංගක් විතර තේරිලා වෙන්න ඕනෙ, පුංචි ඡන්ද කල් දාගන්න දඟංගැට දාන්නේ. එච්චා හරියන්නෑ මයෙ අම්මා! මේ පාර අපේ පරපුරේ කොල්ලො කෙල්ලො ඔක්කොම පාරට බැහැලා, සයිටම් සටන දිනුවා වගේම ඡන්ද අයිතියත් දිනාගන්නවා, ඒක සහතිකයි!.

නූතන සරදියෙල්

# කුඹුක්කන ඉඩම් කොල්ලය



අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි කුඹුක්කන සංරක්ෂිත වනාන්තරයේ අක්කර 200ක් පමණ නීතිවිරෝධීව බැකෝ යන්ත්‍ර යොදා ගනිමින් එළිපෙහෙළි කර මහා පරිමාණ වගාබිම් සැකසීම මේ වන විටත් සිදු කරමින් පවතී. පාරිසරික නීති අභියෝග යට ලක් කරමින් සිදු කරනු ලබන මෙම නීති විරෝධී ක්‍රියා සඳහා පොතුවිල් හි සමහර නීති ලොක්කන්ගේද ආශිර්වාදය ලැබී ඇත.

කුඹුක්කන සංරක්ෂිත වනාන්තරය හැඩ ඔයේ හා කුඹුක්කන් ඔයේ ප්‍රධාන ජල පෝෂකයකි. කුඩුම්බිගල පානම අභය භූමිය, යාල, කුමන සහ ලාහුගල - කිතුලාන ජාතික වනෝද්‍යාන හා සම්බන්ධව ඇති කුඹුක්කන වනාන්තරය ඈත අතීතයේ දී ආරක්ෂිත තත්ත්වයකට පත් කළ සුවිශේෂී වනාන්තරයකි.

1907 අංක 16 දරණ කැළෑ ආඥා පනත යටතේ 1927 අප්‍රේල් 08 වන දින හෙක්ටයාර 37635 ක් පමණ වන වනාන්තර ප්‍රදේශයක් ආවරණය වන පරිදි කුඹුක්කන වන රක්ෂිතය පළමුව ප්‍රකාශයට පත් කර තිබුණි. 2009 අංක 65 දරණ පනතින් අවසන් වරට කැළෑ ආඥා පනත නමින් සංශෝධනය කිරීමෙන් අනතුරුව පනතේ 05 වන වගන්තියට අනුව 2009 පෙබරවාරි 17 වන දින අංක 1589/09 දරණ ගැසට් නිවේදනය මඟින් හෙක්ටයාර 38274 ක් වන කුඹුක්කන සංරක්ෂිත වනාන්තරය ප්‍රකාශයට පත් කෙරිණි. එසේ ප්‍රකාශයට පත්කිරීමේ දී කුඹුක්කන වන රක්ෂිතය පැවති සමයේ දී එළිපෙහෙළි කර තිබූ ඉඩම් කිහිපයක් තුළ අලුතින් වනවගා කිරීමද සිදුකර ඇත.

මෙම සංරක්ෂිත වනාන්තරයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පානම බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රදැල්ල ප්‍රදේශයේ වනාන්තර එළිපෙහෙළි කර, පිවිසුම් මාර්ග සකස් කරමින් යන්ත්‍ර සූත්‍ර භාවිතා කර මහා පරිමාණයෙන් වගාබිම් සැකසීම සිදු කෙරේ. සංවිධානාත්මක ව්‍යාපාරික කණ්ඩායමක් මෙම ක්‍රියාවේ නිරතව සිටින අතර ඔවුන් විසින් නීතිය තමන්ට අවශ්‍ය පරිදි හසුරුවාගනිමින් මෙම නීතිවිරෝධී ක්‍රියාවේ නිරත වේ. එසේම සංරක්ෂණ නිලධාරීන්ට බාධා කිරීම ද දිගින් දිගටම සිදුකෙරෙමින් පවතී.

වන සංරක්ෂණ ආඥා පනතේ 06 වන වගන්තියට අනුව සංරක්ෂිත වනාන්තරයකට අනවසරයෙන් ඇතුළු වීම, ශාක විනාශ කිරීම, වගා බිම් සැකසීම, මාර්ග සකස් කිරීම නීති විරෝධී ක්‍රියාවන් වේ. එවන් ක්‍රියාවකට වරදකරු වන තැනැත්තෙකු වසර 07 ක් නොඉක්මවන කාලයක් දක්වා බන්ධනාගාරගත කිරීමක් හෝ රුපියල් 20,000 ත් රුපියල් 250,000 ත් අතර දඩයකට හෝ මේ දඬුවම් දෙකටම හෝ ලක් කළ හැකිය. එපමණක් නොව සංරක්ෂිත වනාන්තරයක නීති විරෝධී ක්‍රියාවක නිරත වීම සඳහා ආධාර හෝ අනුබල ලබා දෙන පුද්ගලයෙකු ද මෙම දඬුවම්වලටම යටත් කළ හැකිය. ඒ අනුව කුඹුක්කන සංරක්ෂිත වනාන්තරයේ සිදුකෙරෙන නීති විරෝධී ක්‍රියාවලට නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා එල්ල කරන අධිකරණ හා නීති ක්ෂේත්‍රවල පුද්ගලයින් ද වැරදිකරුවන් වෙති.

කුඹුක්කන සංරක්ෂිත වනාන්තරය වටා පිහිටි ලාහුගල, පොතුවිල් හා කරන්කෝව යන ප්‍රදේශවල මහා පරිමාණයෙන් කුඹුරු ගොවිතැන් සිදු කෙරේ. නමුත් මේ ප්‍රදේශවල අලි - මිනිස් ගැටුම ඉතාම අවම මට්ටමක පවතී. ඊට හේතුව කුඹුක්කන සංරක්ෂිත වනාන්තර පද්ධතිය එකිනෙක හා සම්බන්ධව පැවතීමෙන් අලි ඇතුන්ට ඉතාම හොඳ වාසස්ථාන ගොඩනැංවී තිබීමයි.

ඈත අතීතයේ සිටම ආරක්ෂා කළ සුවිශේෂී වනාන්තර පද්ධතියක් වන කුඹුක්කන සංරක්ෂිත වනාන්තරයේ ඉඩම් සංවිධානාත්මක පිරිසක් විසින් විනාශ කරද්දී හා ඊට එරෙහිව නීති ක්‍රියාත්මක කිරීමට බාධා කරද්දී පරිසර අමාත්‍යවරයා වශයෙන් මෛත්‍රීපාල ජනාධිපතිතුමන් සිය මුනිවත රැකීම කණගාටුවට කරුණකි.

ඔහු විසින් ප්‍රකාශ කර ඇත්තේ මෙරට වනාන්තර ගහනය 32% දක්වා ඉහළට ගෙන ඒමට කටයුතු කරන බවය. නමුත් ඒ සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙලක් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත.

2015 සැප්තැම්බර් මස 25 වනදා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයෙන් සම්මත කර ගත් තිරසාර සංවර්ධන ඉලක්ක 17 සැපිරීම වෙනුවෙන් කටයුතු කිරීමට මහා මාධ්‍ය සංදර්ශන පවත්වන වත්මන් ආණ්ඩුව එහි 15 වන ඉලක්කය වන පරිසර පද්ධති සුරක්ෂිත කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම හා ජෛව විවිධත්ව විනාශය නැවැත්වීමට කටයුතු කිරීම වෙනුවට සිදුකරනුයේ ආරක්ෂිත වනාන්තර වැනසීමට ඉඩ දී බලා සිටීමය. මේ නිසා ජනාධිපතිවරයාම පරිසර ඇමති වීම පමණක් මෙකී ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමට හේතු නොවන බව සක්සුදක් සේ පැහැදිලිය.

මේ නිසා අප අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ වත්මන් හා අනාගත පරපුරේ යහපැවැත්ම වෙනුවෙන් ප්‍රකාශයට පත්කර ආරක්ෂා කර ඇති ස්වාභාවික පරිසර පද්ධති, සංවර්ධනයේ නාමයෙන් හෝ ජනාවාස පිහිටුවීම හෝ වාණිජ වගාවන් සඳහා හෝ ආයෝජන සඳහා හෝ භාවිතයට නොග න්නා ලෙසය. ඒ සියල්ල වසර ගණනාවක් තිස්සේ විශාල ධනස්කන්ධයක් වැය කරමින් ජල පෝෂක ලෙස, අලි ඇතුන් ඇතුළු ජෛව ප්‍රජාවගේ වාසස්ථාන ලෙස, ස්වාභාවික ආපදාවලින් ආරක්ෂා වීම සඳහා මෙන්ම ස්වාභාවික සෞන්දර්යය ආරක්ෂා කරගැනීම සඳහා ද රැක බලාගෙන තිබේ. එම ස්වාභාවික පරිසර පද්ධති අද වන විට පුද්ගලයින් කිහිපදෙනෙකුගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් විනාශ කිරීමෙන් සිදුවන්නේ මේ උරුමයන් සියල්ල රටට අහිමි වීමය. ධරණීය සංවර්ධන ඉලක්ක සපුරා ගනිමින්, නීල හරිත ආර්ථිකයක් ගොඩනගා ගැනීමට නම් තරාතිරම නොබලා නීතිය එක ලෙස ක්‍රියාත්මක කළ යුතුව ඇත. එසේ නොමැති වුවහොත් කුඹුක්කන සංරක්ෂිත වනයත් එම වනයේ ජල පෝෂක මත ගොඩනැංවුණු කෘෂිකර්මාන්තයත් අලි ඇතුන් ඇතුළු ජෛව සම්පතත් කෙටි කලකින්ම විනාශ වී යනු ඇත.

*පරිසරවේදී සජීව චාමිකර මහතා විසින් සම්පාදනය කරන ලද ලිපියක් ඇසුරෙනි.*

The Gadget

# අපේ සෞරග්‍රහ මණ්ඩලයට පැමිණි පළමු දූතයා

පසුගිය ඔක්තෝබර් 19 වන දින අපේ සෞරග්‍රහ මණ්ඩලය හරහා වේගයෙන් චලනය වන අද්භූත වස්තුවක් සොයා ගැනිණි. ඒ හවායි විශ්වවිද්‍යාලයේ තාරකා විද්‍යාඥයින් විසින් Pan-STARRS1 නම් දුරේක්ෂය මඟිනි.

මුලින්ම මෙම ග්‍රහ වස්තුව A / 2017 U1 ලෙස හඳුන්වනු ලැබීය. පසුව එය Oumuamua ලෙස නම් කළ අතර දැන් එය 1I/ Oumuamua ලෙස හඳුන්වනු ලබයි.

අධිවේගයෙන් ගමන් කරන එම වස්තුව අන්තර්ජාතික අභ්‍යවකාශයේ සිට පැමිණි පුරාණ වල්ගාතරුවක් යැයි විද්‍යාඥයින් මුලින්ම සැක පළ කළේය. නමුත් වැඩිදුර නිරීක්ෂණවලදී පෙනී ගියේ එය තවත් තරු පද්ධතියක් ඇති ග්‍රහයෙක් බවයි. වසර ගණනාවක් තිස්සේ මෙවැනි වස්තූන් එහා මෙහා



ගමන් කර ඇති අතර පළමු වතාවට සාක්ෂි සහිතව එය හමු වූ ග්‍රහවස්තුව මෙය බව විද්‍යාඥයින් පවසයි. මෙම සොයාගැනීම මඟින් වෙනත් සූර්ය පද්ධති පවා සොයාගැනීමේ නව කවුළුවක් විවෘත වී ඇත.

වසර මිලියන ගණනක් පුරා අන්තර්ජාතික අභ්‍යවකාශය හරහා ගමන් කර ඇති නිසා විශ්වය පිළිබඳ නව තොරතුරු රාශියක් එමඟින් සොයාගැනීමට හැකි වෙතැයි විද්‍යාඥයින් මත පළකරයි. මෙම වස්තුව අඩි 1300ක් පමණ (දිග මීටර් 400 ක) දිගකින් යුත් ලෝහ සමඟ මිශ්‍ර වී ඇති පාෂාණවලින් යුතු බවට පර්යේෂකයින් සැක පළකරයි.

“මෙම අද්විතීය වස්තුව නිරීක්ෂණය කිරීමට අපි නිරතුරුවම උත්සාහ කරමු. එය කොහේ සිට පැමිණියේ ද හා එය කුමන මන්දාකිණිවල චාරිකා කර ඇත්ද යනාදිය නිරීක්ෂණය කිරීමට අප බලාපොරොත්තු වනවා” යනුවෙන් ජර්මනියේ ගාර්චින් හි නිරීක්ෂක කණ්ඩායමේ ඔලිවියර් හයින්ටු (Olivier Hainaut) පැවසීය.

Sports

# ලොක්කන්ගේ දාම්පෙතක් වූ ක්‍රිකට්



ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම මේ වනවිටත් පිට පිට තරඟ 15ක් පරාජය වී අවසන්ය. ක්‍රිකට් පරාජය වීමට හේතුව ලෙස බොහෝදෙනා විවිධ තර්ක ඉදිරිපත් කරයි. ඒවායේ යම් සත්‍යතාවයක් ද ඇත. එලෙස තාක්ෂණික දෝෂ නැතුවාම නොවේ. නමුත් එම තාක්ෂණික දෝෂ මගහරවා ගනිමින්, එක් කණ්ඩායමක් ලෙස ක්‍රීඩා කිරීමේ අවස්ථාව ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට ලබා නොදුන්නේ පරිපාලකයන්ගේ වෙනත් උවමනාවන් නිසාය. එය ද පරාජය වීමට බරපතල හේතුවකි.

එය තහවුරු වන්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම 2015 ලෝක කුසලාන තරඟාවලියෙන් පසු ක්‍රීඩකයින් යොදාගත් ආකාරය දෙස බලන විටය. තරඟ 50ක් ක්‍රීඩා කිරීමට ක්‍රීඩකයින් 48 දෙනෙක් යොදාගෙන ඇති අතර ඒ තුළ එම තරඟාවලින් තරඟ 40ක් හෝ ක්‍රීඩා කළ එකදු ක්‍රීඩකයෙක්වත් නොමැත. කණ්ඩායමක ස්ථාවරභාවය රැකගැනීමට නම් ස්ථාවර ක්‍රීඩකයින් අවම ප්‍රමාණයක්වත් සිටිය යුතු බව ක්‍රිකට් බලධාරීන් නොදනී ද?

නමුත් බංගලාදේශ කණ්ඩායම පසුගිය තරඟ 35කට යොදාගෙන ඇත්තේ ක්‍රීඩකයින් 27 දෙනෙක් පමණි. ඉන් 08 දෙනෙක්ම ස්ථාවරව තරඟ 23කට ක්‍රීඩා කර ඇත. එසේම එංගලන්ත කණ්ඩායමද පසුගිය තරඟ 53ක් සඳහා යොදාගෙන ඇත්තේ ක්‍රීඩකයින් 27 දෙනෙක් පමණි. එයින් 10 දෙනෙක්ම ස්ථාවර ලෙස තරඟ 32කට වැඩි ප්‍රමාණයක් ක්‍රීඩාකර ඇත. ක්‍රිකට් කණ්ඩායමක් සැලසුම් කළ යුත්තේ ඒ ආකාරයට නොවේ ද? එහෙත් මෙරට කණ්ඩායම සැලසුම් කිරීම කෙසේවෙතත් වසර 02ක් තුළ තේරීම් කමිටුව පවා 04 වතාවක් වෙනස් කොට ඇත.

මෙලෙස මුදල් හා පුද්ගලික අභිලාෂයන්ට යට වූ ක්‍රිකට් ලොක්කන් සිටින රටක ඔවුන් තම පටු ලාභ උවමනාවන් වෙනුවෙන් ක්‍රිකට් කණ්ඩායම "දාම්පෙතක්" බවට පත්කරගත් පසු, පරාජයේ අම්හිරි අත්දැකීම් විඳීමට ක්‍රිකට් ලෝලීන්ට සිදුවීම තවදුරටත් අරුමයක් නොවනු ඇත....!

# ක්‍රීඩකයින්ට ක්‍රීඩාව එපා කරවීම



නිලූකා ගීතානි රාජසේකර යනු දිගුදුර ඉසව්වකින් ඔලිම්පික් වරම් ලද අපේ රටේ ප්‍රථම ක්‍රීඩිකාවයි. මුහුණු පොතේ හැඬූ කඳුළින් පළ වූ වීඩියෝවක් නිසා පසුගිය දිනවලදී ඇය ගැන වැඩිපුර කතාබහට ලක්විය. දැන් කාගේත් ඇස් ඇරී පිරිසක් එම ක්‍රීඩිකාවට සැලකීමට මෙන්ම තවත් පිරිසක් ඇයව ක්‍රීඩාවෙන් නෙරපීමටද කටයුතු සැලසුම් කරනවා නියතය.

නමුත් ඒවායින් යටගිය ඇත්ත වසන් කිරීමට නොහැක. දකුණු පළාත් සභාවේ බොහෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීමට ලක්කර නිවාස ලබාදුන් සජිත් ප්‍රේමදාස මහතා නිලූකා ගීතානි ක්‍රීඩිකාව ගැන නොදන්නේ මන්ද යන්න ගැටලුවකි.

ඇය ඔලිම්පික් වරම් ලද ක්‍රීඩිකාවකි. ශ්‍රී ලංකා මැරතන් වාර්තාව විනාඩි 11කින් අලුත් කළ ක්‍රීඩිකාව ඇයයි. ඇයගේ හොඳම දක්ෂතාවය පැය 2 විනාඩි 40 කි. වසර 28ක් තිස්සේ ජාතික හා ජාත්‍යන්තර වශයෙන්ද තරඟ වදින අපට සිටින ප්‍රවීණම ක්‍රීඩිකාවකි. ඇය ගැන ලොවම දනී, එහෙත් සජිත් ප්‍රේමදාස නොදනී.

අනිත් කාරණය නම් ඔලිම්පික් යාමට සූදානමින් සිටින මැය මෙරට කිසිඳු සංචිතයක නැති වීමයි. වසර 02කින් පුහුණු තරඟයක් ලබා දී නොමැත. ක්‍රීඩා අමාත්‍යංශයෙන් හෝ කිසිඳු මුදලක් නොලබන නිලූකාගේ පුද්ගලික වියදමෙන් විදෙස් තරඟ සඳහා සහභාගී වන්නේද රට වෙනුවෙනි. මෙම විදෙස් තරඟ සංචාර සඳහා පුහුණුකරුවන් රැගෙන යාමට පවා ඇයට දේශපාළුවන් ඉදිරියේ වැඳවැටීමට සිදුව ඇත.

ඉදින් ජාත්‍යන්තරය දිනූ ක්‍රීඩිකාවන්ගේද තත්වය මෙය නම් ඔවුන්ට අපේ රටේ ක්‍රීඩාව මෙන්ම රට ද එපා වීම වැඩි ඈතක නොවේ...

# ඉඩකඩට අභියෝග කළ ධාවන පථය



චීනයේ තින්තායි ප්‍රදේශයේ පාසල් ගොඩනැගිල්ලක ඉහළ මහලේ ඉදිකළ විශ්මිත නිර්මාණයක් වන්නේ එහි ඇති ධාවන පථයයි. ජනාකීර්ණ ප්‍රදේශයක් වන තින්තායි හි 2014 වසරේ ඉදිකළ මෙම ධාවන පථය එම පාසලේ ළමුන් 1800 ක් පමණ භාවිතා කරයි. දරු දැරියන්ට කිසිඳු අවධානමකින් තොරව ක්‍රීඩා කිරීමට හැකි මෙම ධාවන පථය මීටර 200 ක් දිගය.

ඉඩකඩ අඩු වුවත්, ක්‍රීඩාවට ඇති වුවමනාව නිසාම ගොඩනැගුණු මෙම ධාවන පථය මඟින් චීන තාක්ෂණය මෙන්ම සැලසුම්සහගත බවද මනාව පිළිබිඹු කෙරේ.

එහෙත් අපේ වැනි රටක ඉඩකඩ කෙතරම් තිබුණ ද ක්‍රීඩාවට සුදුසු එකදු ධාවන පථයක් හෝ නොමැති වීම කණගාටුවට කරුණකි.

# කවි නිර්මාණය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**

ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන්කරන්න.
මෙන්න අපගේ ලිපිනය

*FORWARD කවිපිටුව,*
*අංක 464/20, පන්නිපිටිය පාර,*
*පැලවත්ත, බත්තරමුල්ල.*

## නුඹේ හිමිකම

ස්නේහයෙන් හදවත් පිරුණ
ජාතියේ මව්පියන්
පය ගහන පොළොවක
නුඹට හිමි සෙනෙහස
කොහේ නම් සැඟවුනි ද...?

නිදහසේ අකුරු කරනට
සිහින දකින නුඹට
දෑස් හැර පියනගන්නට
නුඹ නමින් තැනුන
පාරාදීසයන් කොහි ද...?

සියල්ලකටම මිල කියන
උන්ගේ සිස්ටමය තුළ
සෙනෙහසත් අකුරත්
තව මොහොතකින් නුඹවත්
රුපියලට සින්න
වෙනු නොහැකි ද...?

] **හිරුමාලි දිසානායක** [



## 1989

සොහොනක් නොදනිතත්
ඔබ නිදන
ගහක, කොළක, මලක
මේ විශ්වයේ කොතැනක
ඔබ සිටින නිසාවෙන්ද
නොවැම්බරය මේ තරම් සීතල...

] FB **ඇසුරෙන්** [



## ගස් කැපීම

මනින වට අඩි
ගණින ලී අඩි
ලියන බලපත්
මහත්වරුනේ..
කපා මුලගින්
දපා මේ බිම
හෙළුද පසු
මේ තුරු රජාණෝ..
සෙවණ ඉඳගෙන
පවන විඳගෙන
සැනහුනෝ
මක් කරත්දෝ...?
වැටෙන විට ගස්
තැලෙන පොඩි පැළ
මනින්නේ කොයි කවුරුදෝ
හැදෙන්නට පෙර
තලන්නට පැළ
දුන්නේ බලපත් කවුරුදෝ...?

] **සමන්ත රූපසිංහ** [

## අලුත් හිරු

අඳුරු වළා යට
සැඟව ගිය හිරු
මියැදුණා යැයි සිතා
කළු වලා කුළකට,
බිය වී හිරු නැවත
නොඑ් යැයි මොරදෙන
කුරුලු රංචුවකට
ඇති තතු කියන්නට,
හිරු මියැදුණා නොව
වලාවෙන් මුවා වී
හෙට නැවත අලුත් වී
නැගෙන බව දකින්නට,
හැකි වෙතැයි හිරු
දිනක මියැදෙතැයි
නොසිතන්න
සියොතුන්ට පවසන්න,
වලාවේ ඈත් වී
හිරු එළිය
පෙන්වන්න
හැමදාම....

] **ගාමිණී දිසානායක** [

## නුඹ ගිය මගෙහිම

ඉරුණු උරපත්
රිදුනාද නුඹට..?
කැකෑරෙන වේදනාව
දැරුවාද නිහඬවම..?
එන්න තිබුණා නම් මටත්
වෙන්න නුඹේ හස්තය
අසිපතක ලෙස රකින්නට
නුඹත් සමඟින් සත්‍යය..!
දහක් උන් මැද
නොසිට සිටිමින් වහල්කම
නුඹත් නායකයෙක්
සටන් බිම දැල්වුණ..!
ඉතින් මගේ පෙම්වත,
අපේ පුතු සිහිනයෙන්
හිනැහෙන්නේ නුඹටද..?
කියනවද බොහෝ දේ
දුක් විඳින ලොවක් ගැන?
හෙට නැගෙන අරුණ ලොව
යදම් නෙක බිඳ පෙරට
ඔහුත් ස්පාර්ටකස් !
නුඹේ මගම යනෙනු ඇත..
වෙරේනියා...

] **මියැසි දිමෝෂා**[



# අද තරුණයාට ජීවත් වීමට සිදු වී තිබෙන්නේ ෆැන්ටසියක් තුළයි




*"කුඹියෝ" කියන්නේ මේ දවස්වල පුංචි තිරයේ ඉතා ජනප්‍රිය ටෙලිනාට්‍යයක්. එහි එන ප්‍රධාන චරිතයක් වුණු ප්‍රියන්තගේ චරිතයට පණ පොවන්නේ කළණ ගුණසේකරයි. මේ FORWARD ඔහු සමඟ කළ කතා බහයි.*

**කළණ ගුණසේකර, ඔබව හඳුන්වා දෙනවට කැමති කොහොමද?**

ඇත්තෙන්ම මම මාව දන්නේ වේදිකා නාට්‍ය නළුවෙකු ලෙසයි. මම මුලින්ම වේදිකා පරිපාලකවරයෙක් විදියට වැඩ කළා. දැනට ටෙලිනාට්‍ය හා වේදිකා නාට්‍ය නළුවෙකු ලෙසත්, අධ්‍යක්ෂකවරයෙකු ලෙසත් කටයුතු කරනවා. රංගනය ප්‍රධාන විෂයක් ලෙස සලකා වැඩ කරගෙන යන අතරම, සාමාන්‍ය මනුෂ්‍යයෙක් ලෙස මේ සමාජයේ ජීවත් වෙනවා.

**මෙතෙක් ආ ගමන් මග ගැන කෙටියෙන් කිව්වොත්?**

මම අධ්‍යාපනය ලැබුවේ පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයේය. පාසල් කාලය තුළ දී මුතුහර ළමා සමාජය සමඟ සම්බන්ධ වී නොයෙකුත් කලා හා වෙනත් විෂය බාහිර කටයුතුවල නියැලුණා. විවාද කණ්ඩායම සමඟ ද සම්බන්ධ වී සිටියා. මගේ රංගන ජීවිතය ආරම්භ වන්නේ පාසල් කාලයේදීමයි. පසුව ප්‍රේමකුමාර කරුණාරත්න සමඟ නාට්‍ය කටයුතුවලට සම්බන්ධ වෙනවා. මුලින්ම වේදිකා පරිපාලකයෙකු ලෙසත්, පසුව රංගන ශිල්පියෙකු ලෙසත් සම්බන්ධ වෙනවා. මේ කාලය වනවිට ධර්මප්‍රිය ඩයස් හා සරත් කොතලාවල යන කලාකරුවන් සමඟ සම්බන්ධ වී නාට්‍ය කණ්ඩායමක් හදාගෙන පසුව ටෙලිනාට්‍ය හා චිත්‍රපට කලාවන් සමඟ සම්බන්ධ වුණා. දැනට දිගටම කලා කටයුතු කරගෙන යනවා.

**කලාකරුවෙකුගේ ජීවිතයේ ඉදිරි ගමන සඳහා සම්මාන කොයිතරම් දුරට ඉවහල් වෙනවද?**

කලාකරුවා සම්මානයක් ලබාගැනීමේ අරමුණින් කලාව කළ යුතුයි කියලා මම විශ්වාස කරන්නෙ නැහැ. කලාකරුවාට යම්කිසි සම්මානයක් ලැබීම ඔහුගේ කලා ජීවිතයට ලැබෙන මානසික දිරිගැන්වීමක්. ඒ සම්මානය ලැබීම නිසා සම්මානලාභී කලාකරුවා ජනතාව අතර පිළිගැනීමකට ලක්වෙනවා. නමුත් මම විශ්වාස කරන කලාකරුවා සම්මාන ලැබීම නිසා ඔහුගේ නිර්මාණ, ජනප්‍රිය දිශාවට වෙනස් නොකළ යුතුයි. මේ හැමදෙයටම වඩා කලාකරුවාට වටින්නේ ජනතා සම්මානයයි.

**කලා ජීවිතයේ ඔබ ලබාගත් ජයග්‍රහණ සඳහන් කළොත්?**

පළමු වැනි ජයග්‍රහණය වන්නේ ප්‍රේක්ෂකයා හා මා අතර ඇති සම්බන්ධයයි. මට 2012 යෞවන නාට්‍ය උළලේ හොඳම නළුවා ලෙසත්, යෞවන සම්මාන උළලේ 'ග්ලැඩියේටර් ප්‍රේමය' වේදිකා නාට්‍යය සඳහා හොඳම නළුවා ලෙස ජූරියේ විශේෂ සම්මානයකුත් හිමිවුණා. ඒ වගේම 'ඊගෝ නගරය' නාට්‍යයේ හොඳම නළුවාට හිමි සම්මානයත් හිමි වුණා. ඊට අමතරව හොඳම නළුවාට හිමි සම්මාන සඳහා කිහිප වතාවක්ම නිර්දේශ වීත් තිබෙනවා. හොඳම නළුවාට හිමි 'සිග නීස්' සම්මානයත් ලැබුණා. ඊටත් අමතරව මා රඟපෑ ටෙලිනාට්‍යවලින් බහුතරයක් සඳහා කුමක් හෝ සම්මානයක් ලැබී තිබෙනවා.

**සමාජ මතයන් ගොඩනැගීමේදී කලාව කොතරම් වැදගත් ද?**

සමාජ මතයක් ගොඩනැගීම සඳහා තිබෙන හොඳම අමුද්‍රව්‍ය කලාව හා ආයුධයි. මේ වෙලාවේ ආයුධවලට සමාජ මතයක් ගොඩනැගීමට හැකියාවක් නෑ. නමුත් ප්‍රේක්ෂකයා ඕනෑම දෙයක් බුද්ධියෙන් විග්‍රහ කර ගන්නවා. එය වින්දනයට ලක් කරගැනීම සඳහා කලාව අනිවාර්යයි. එහෙම නොවුනොත් ඔවුන් සමාජය තුළ වෛරය හා ක්‍රෝධය පතුරවන්නට පෙළඹෙනවා. මිනිසා සිතීමට ගන්නේ, ඇසෙන් බලලා කනෙන් අහලා. නමුත් ඔළුවට දා ගත් විට විඳීමට හැකි වෙන්නේ කලාවෙන් පමණයි. යම්කිසි සමාජ සම්මතයක් අත්කර ගැනීම සඳහා මිනිසාට ලබාදිය හැකි හොඳම ප්‍රතිකාරය කලාවයි. සමාජය විශ්වාස කරන ආකාරයට කලාව තමයි සියලු හැඩයන් තීරණය කරනුයේ.

> **"මුදල" කියන කාරණාව අහෝසි වන සමාජ වටපිටාවක් ඇති කරලීම සඳහා මැදිහත් වීම පොදු තාරුණ්‍යයෙහි කාර්යය විය යුතුයි.**

**අපේ රටේ පොදු තරුණයා මුහුණ දෙන අභියෝග ගැන ඔබට තියෙන්නේ කවර හැඟීමක් ද?**

මම මේ ප්‍රශ්නය මේ ආකාරයට විග්‍රහ කරන්න කැමතියි. අද ලංකාවේ ටෙලිනාට්‍ය කලාව හැර වේදිකා නාට්‍ය, වීදි නාට්‍ය හා සිනමාව විශාල ප්‍රායෝගික ප්‍රශ්නයකට මුහුණ දී තිබෙනවා. ඒ එම කලා කෘති බලන්න ප්‍රමාණවත් ප්‍රේක්ෂකයින් පිරිසක් නොමැති නිසායි. මේ තත්වය හොඳ හෝ නරක හැම නිර්මාණයකටම පොදු කාරණයක් බවට පත් වෙලයි තියෙන්නේ. එදිනෙදා පැනනැඟෙන ප්‍රශ්න විසඳනවා තබා අද පොදු තරුණයාට පමණක් නොවෙයි ඔහුගේ පියාට, සීයාට ඔහුගේ ඉපදෙන්නට ඉන්න පුතාට පවා දිවට අමුතු රස දැනගැනීමට, කන ඇස පිනවීමට නොහැකි වී තිබෙනවා. ඔබ දන්නා ලෙසටම මෙයට හේතුව වෙන්නේ මුදල් නැමැති ආර්ථික, දේශපාලන කාරණාවයි. රැකීරක්ෂා නැති, වෘත්තීය ගරුත්වයක් නැති පොදු තරුණයාට සිදු වී තිබෙන්නේ වසර 4න් 4ට විසඳුම් දෙනවා යැයි ෆැන්ටසි මවන වටපිටාවක ජීවත් වීමටයි. ඉතින් මේ ක්‍රමය තුළ තාරුණ්‍යය අර්බුදයට පත්වීම අරුමයක් නොවෙයි. තාරුණ්‍යය පමණක් නොවෙයි, සියලුම ප්‍රජාව අර්බුදයකට ලක්වෙලා. ඉහත ක්‍රමය තුළ කලාකරුවා ඉතා අමාරුවෙන් ලයිට් බිල, වතුර බිල ගෙවන යුගයක ඔහුගෙන් හොඳ නිර්මාණ බිහි වෙන්නෙ නෑ. මේ සියලු කාරණාවලින් තාරුණ්‍යය ඇතුළු සමාජය මුදවාගැනීමට මෙම ''මුදල'' කියන කාරණාව අහෝසි වන සමාජ වටපිටාවක් ඇති කරලීම සඳහා මැදිහත් වීම පොදු තාරුණ්‍යයෙහි කාර්යය විය යුතුයි. මෙම පොදු අර්බුදයට විසඳුම තිබෙන්නේ එතැනයි.

**FORWARD තරුණයා ඉලක්ක කරගත් පුවත්පතක්. ඒ ගැන ඔබට දැනෙන්නේ කොහොමද?**

තාරුණ්‍යයට පමණක් නොවෙයි සියලු පුද්ගලයන් ඉලක්ක කරගත් මාධ්‍යයේ හිඩැසක් තිබෙනවා. අද අපි දකින විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් කුමක් ද කරන්නේ? මොනවාද ජනතාවට ලබා දෙන්නේ කියන එක ගැටලුවක්. T.V දමපු වෙලාවේ ඉඳලා ප්‍රේක්ෂකයන්ට මොනවාද දෙන්නේ කියන එක ප්‍රශ්නයක්. මේ යුගය කියලා කියන්නේ දැනුම ලබා දී ජනතාවගේ මොළ හදන මාධ්‍යයක අවශ්‍යතාවය දැඩිව දැනෙන යුගයක්. එම කාර්යය ඔබ පුවත්පත විසින් ඉටු කරන්නේ නම්, එය තාරුණ්‍යයට හා අනාගත තරුණයාට කරන සුවිශේෂී කාර්යභාරයක් වේවි.

**ඔබට අපේ රටේ තරුණයාට ලබාදීමට ඇති පණිවිඩය කුමක්ද?**

ඇත්තටම මම පණිවිඩයක් දීමට සුදුසු පුද්ගලයෙක් නොවෙයි කියලයි මම විශ්වාස කරන්නෙ. මම පණිවිඩයක් දීමට අවශ්‍ය නැහැ. මේ සියලුදෙනාට මෙය තේරෙනවා. මම කරන්නේ සියල්ලන්ට තේරෙන කොටස් උළුප්පා කියන එක පමණයි. තම තමන් හිතලා බලන්න තමන්ට ගන්න පුළුවන් මොන වගේ තීරණද කියලා. ඒක මම පණිවිඩයක් දෙනවාට වඩා වැදගත් වේවි.

# තරුණ උළෙල පුරාම SYU නම ඉහළින් ඔසවා තැබීමට අපට හැකි වුණා



**19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල පසුගිය මස රුසියාවේදී පැවැත්වුණා. එහි ජාත්‍යන්තර සූදානම් කිරීමේ කමිටු සාමාජිකයෙක් වශයෙන් ඔබ ලැබූ අත්දැකීම් මොන වගේද ?**

WFDY විසින් සංවිධානය කරන ලද 19 වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල (WFYS) පසුගිය ඔක්තෝබර් මස 14 වැනි දින ආරම්භ වී 22 දින අවසන් වුණා. එම උළෙල එලෙස දින 09ක් වැනි කෙටිකාලයක් තුළ පැවතියත් ඒ සඳහා වසර ගණනාවක් තිස්සේ සූදානම් කිරීමේ කටයුතු සිදු කිරීමට WFDY යට සිදුවුණා. එහි අවසන් අදියරේදී ජාත්‍යන්තර සූදානම් කිරීමේ කමිටුව IOC පිහිටුවනු ලැබුයේ ලෝකයේ කලාප 05 ක් නියෝජනය කරමිනුයි. ඒ අනුව ආසියානු පැසිෆික් කලාපය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික සූදානම් කිරීමේ කමිටුව නියෝජනය කරමින් මා එයට සහභාගී වූවා. එහිදී මාස 02ට ආසන්න කාලයක් තිස්සේ රුසියාවේ මොස්කව් හා සෝචි නගරවල පැවති සූදානම් කිරීමේ කටයුතුවලට ජාත්‍යන්තර සූදානම් කිරීමේ කමිටුවේ සාමාජිකයෙක් ලෙස සහභාගී වුණා.

IOC නියෝජනය කළ අනෙකුත් සංවිධාන වාමාශික හෝ ප්‍රගතිශීලී ඒවා විය. ඉතින් ඔවුන් සමඟ මෙම කාලය පුරාවට වැඩ කිරීමෙන් විශාල අත්දැකීම් රාශියක් ගතහැකි වූවා. එමෙන්ම මෙම කාලය තුළදී එම සංවිධාන කටයුතු සඳහා රුසියානු ආණ්ඩුවේ අනවශ්‍ය මැදිහත්වීම්වලට එරෙහිව සාමූහිකව කටයුතු කර විවිධ බාධක මධ්‍යයේ වුව අවසානයේදී සාර්ථක උළෙලක් පැවැත්වීමට හැකිවුණා. මෙම කාලය තුළ ලැබූ අත්දැකීම් පෞද්ගලිකව වගේම සංවිධානයක් ලෙස සමාජවාදී තරුණ සංගමයටත් ඉදිරි කටයුතු සඳහා විශාල පිටිවහලක් වේවි.

**අවසන් වූ 19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට ශ්‍රී ලාංකීය තාරුණ්‍යය වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමයේ විශාල පිරිසක් සම්බන්ධ වුණා. මේ ගැන සඳහන් කළොත්?**

ඔව්, SYU නියෝජනය කරමින් විශාල පිරිසක් සහභාගී වුණා. ඇත්තටම සැබෑ ලාංකීය තාරුණ්‍යය ඔවුන් විසින් නියෝජනය කරනු ලැබුවා. උළෙල පුරාවටම පැවති දේශපාලන සාකච්ඡා හා අනෙකුත් අංගවලට ඉතාමත් උනන්දුවකින් සහභාගී වෙමින් හා වාමාංශික පක්ෂවල තරුණ සංවිධාන සමඟ සබඳතා ගොඩනගා ගනිමින් SYU නම උළෙල තුළ ඉහළින් ඔසවා තැබීමට හැකි වුණා. එමෙන්ම එහිදී පැවති විවිධ වැඩසටහන්වලදී SYU සාමාජිකයින් විසින් දක්වන ලද අදහස් විශේෂයෙන් අගය කිරීමට ලක්වුණා.

**ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ නව උපසභාපතිවරයා ලෙස ඔබව පත්වුණා. ඔබට එම ධූරයේ පැවරී ඇති කාර්යභාරය මොකක්ද ?**

ඔව්, WFDY හි සභාපති, ලේකම් හැරුණු විට අප්‍රිකානු, මැදපෙරදිග හා ආසියානු පැසිෆික් කලාප සඳහා උපසභාපතිවරුන් පත්කරනු ලබනවා. ඒ අනුව ආසියානු පැසිෆික් කලාපයේ උපසභාපති ධූරය අපට හිමිවීම විශාල ජයග්‍රහණයක්. WFDY හි ප්‍රධානම කාර්යය වන්නේ ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල පැවැත්වීමයි. එහි මූලස්ථානය පිහිටා ඇත්තේ හංගේරියාවේ බුඩාපේස්ට් නගරයේයි. එහි රැඳීසිටිමින් කලාපයේ සාමාජික රටවල් සමඟ WFDY හි කාර්යයන් සම්බන්ධීකරණය කිරීමේ වගකීම අප සතුයි.

**අවසාන වශයෙන් ඉදිරියේ දී WFDY හි ජාත්‍යන්තර කටයුතු හා ඉදිරි ක්‍රියාමාර්ග ගැන සඳහන් කළොත්?**

WFDY කියන්නේ ලොව පුරා පැතිරුණු විශාලතම අධිරාජ්‍ය විරෝධී තරුණ සංවිධානයයි. තවදුරටත් ලොව පුරා ප්‍රගතිශීලී, අධිරාජ්‍ය විරෝධී සංවිධාන ඒ සඳහා එකතු කරගත යුතුයි. එමෙන්ම ලොව කොතැනක හෝ අධිරාජ්‍යවාදී මැදිහත් වීමක් සිදුවන්නේ නම් කොන්දේසි විරහිතව එයට එරෙහිව මැදිහත් වීමට WFDY ඉදිරිපත් වෙයි.

## 2017 වසරේ විශාලතම භූ කම්පනය මැදපෙරදිගට



නොවැම්බර් 12 වෙනි දින ඉරානය හා ඉරාකය අතර උතුරුදිග දේශසීමාවේ ඇති වූ ප්‍රබල භූ කම්පයෙන් මරණ 450ක් පමණ සිදුවී 7000කට ආසන්න පිරිසක් තුවාල ලබා ඇතැයි වාර්තා වේ. මෙම භූ කම්පනයෙන් වැඩියෙන්ම හානි සිදුවී ඇත්තේ බටහිර ඉරානයේ කර්මන්ෂා ප්‍රදේශයටයි.

යම් අවශ්‍යතාවයක් මතු වුවහොත් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සහන සැලසීමට හැකි බව ද පවසා ඇත. මෙම භූ කම්පනයෙන් පසු අපකම්පන රැසක්ම තුර්කිය, ඊශ්‍රායලය සහ කුවේටය වෙත දැනී ඇති බවද වාර්තා වේ.

## ආහාර පිරී රොකට්ටුවක් ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයට



ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය වෙත චොකලට්, අයිස්ක්‍රීම් හා සිසිල් කරන ලද පලතුරු ඇතුළත් කිලෝග්‍රෑම් 7400ක බරින් යුතු ආහාර ද්‍රව්‍ය තොගයක් රැගත් රොකට්ටුවක් පසුගියදා පිටත්ව ගිය බව විදෙස් මාධ්‍ය පවසයි. මෙම රොකට්ටුව මිනිසුන් රහිත එකක් බවත් වාර්තා වේ. අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ රැඳී සිටින ගගනගාමීන් 06 දෙනාගේ පරිභෝජනය සඳහා මෙම ද්‍රව්‍ය යවා ඇති බවත් මෙම රොකට්ටුව මඟින් පීසා යැවීමට ද කටයුතු කර ඇති බවත් දැනගන්නට ඇත.

## ගාසා තීරයේ දේශසීමා කටයුතු පලස්තීන පාලනයට



දශක ගණනාවක් තිස්සේ පැවති අභ්‍යන්තර අසමගිය නැවැත්වීමේ අරමුණින් ඊජිප්තුවේ මැදිහත් වීමෙන් හමාස් හා ෆාටා සංවිධාන අතර පසුගිය දා ගිවිසුමක් ඇති කරගන්නා ලදී. මෙම ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ගාසා තීරයේ හා ඊජිප්තු දේශසීමාවල පාලන කටයුතු පලස්තීන පාලනාධිකාරියට ලබා දීමට හමාස් සංවිධානය කටයුතු කර ඇතැයි වාර්තා වේ.

එහෙයින් ගාසා තීරය හා ඊශ්‍රායලය සම්බන්ධ වන දේශසීමාවෙන් ද ගාසා තීරය හා ඊජිප්තුව අතර දේශසීමාවෙන් ද හමාස් සංවිධානය ඉවත් වී ඒ වෙනුවට පලස්තීන අධිකාරියේ සේවකයන් ඒ සඳහා පැමිණ ඇතැයි ද වාර්තා වේ.

## ලෝක ජනගහනයෙන් 60% කට ආරක්ෂිත වැසිකිලි නැහැ




නොවැම්බර් 19 දිනට යෙදුණු ''ලෝක වැසිකිලි දිනයේ දී'' එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශ කර සිටියේ ලෝක ජනගහනයෙන් 60% කට තවමත් ආරක්ෂිත වැසිකිලි පහසුකම් නොමැති බවයි. විශේෂයෙන්ම ඉන්දියාව හා චීනය යන රටවල ජනතාව තවමත් අවිධිමත් වැසිකිලි භාවිතය සිදුකරන බව දැනගන්නට ඇත. ඉන්දියාව තුළ මෙය දේශපාලනමය කරුණක් බවට ද පත්ව ඇත. කෙසේ වුවද මළ අපද්‍රව්‍ය හා අපජලය නිසි පරිදි කළමනාකරණය කිරීම වැදගත් බවත් ඒ මඟින් පොහොර නිෂ්පාදනය කිරීමට හැකියාවක් පවතින බවත් එක්සත් ජාතීන් විසින් වැඩිදුරටත් පෙන්වා දෙයි.


## මුගාබේ පාලනය බිඳ වැටේ



සිම්බාබ්වේ හි රාජ්‍ය බලය එරට හමුදාව යටතට පත්වීමෙන් අනතුරුව හිටපු ජනපති රොබට් මුගාබේ වෙනුවට නව ජනාධිපතිවරයෙක් පත්කර ඇති බව වාර්තා වේ. ඔහු නමින් එමර්සන් මන්ගග්වායි වන අතර කෙසේ වුවද මෙම කුමන්ත්‍රණය පිටුපස මුගාබේ විසින්ම ධූරයෙන් නෙරපනු ලැබූ එරට හිටපු අගමැතිවරයාද සිටින බව විදෙස් මාධ්‍ය වාර්තා සඳහන් කරයි.

මේ අතර 1980 දී මුගාබේව බලයට ගෙන ඒමට කටයුතු කළ පිරිස්ම ඔහුව බලයෙන් නෙරපීමට ද කටයුතු කර තිබීම විශේෂත්වයකි.

*විශ්වයේ බිහිවීම පිළිබඳ ලොව පිළිගත් මතවාදය එනම් "Big Bang" එක ගැන අපි කතා කළෙමු. අප අද සාකච්ඡාවට බඳුන් කරනුයේ විශ්වයේ බිහිවීම පිළිබඳව පැවති අනෙකුත් මතවාදයන් හා විශ්වයේ ප්‍රථම පරමාණුව ඇති වීම දක්වා ක්‍රියාවලියයි.*




# අරුම පුදුම විශ්වයේ බිහිවීම

විශ්වයේ බිහිවීම පිළිබඳ විවිධ මතවාදයන් ඇත. මෙම මතවාදයන් පහත ආකාරය.

ස්ථාවර තත්ත්ව වාදය

නව ස්ථාවර තත්ත්ව වාදය

ස්පන්දනමාන විශ්ව වාදය

**ස්ථාවර තත්ත්ව වාදය**

මෙම මතය මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ ඕස්ට්‍රේලියානු ජාතිකයෙකු වූ හර්මන් බොන්ඩි හා තෝමස් ගොල්ග් යන විද්‍යාඥයින් දෙදෙනාය. පසුව බ්‍රිතාන්‍ය ජාතික ෆ්‍රෙඩ් හොයිල් විසින් එය තවත් පැහැදිලි කරන ලදී.

මේ මතයෙන් ප්‍රකාශ වන්නේ ඈත අතීතයේ සිට මේ දක්වා විශ්වය එකම ස්වරූපයෙන් පැවති බවත් අනාගතයේදී ද එම ස්වරූපයෙන්ම පවතින බවත්ය.

මෙම මතයෙන් ප්‍රකට වන මූලික අදහස්

1. විශ්වයේ ඇති චක්‍රාවාට නිරන්තරයෙන්ම ප්‍රසාරණය වෙයි
2. චක්‍රාවාට කලින් කලට අතුරුදහන් වෙයි.
3. ඒ වෙනුවට නව චක්‍රාවාට පහළ වෙයි.

**නව ස්ථාවර තත්ත්ව වාදය**

නව ස්ථාවර තත්ත්ව වාදය ඉදිරිපත් කිරීමට මුල් වූයේ බ්‍රිතාන්‍ය ජාතික ෆ්‍රෙඩ් හොයිල් සහ ශ්‍රී ලාංකික විද්‍යාඥ චන්ද්‍රා වික්‍රමසිංහ හා ඉන්දියානු ජාතික ජයන්ත් නාලිකර් යන විද්වතුන්ය.

මේ මතයෙන් ප්‍රකාශ වූයේ විශ්වය ආරම්භයක් නැති අසීමිත වයසක් ඇති දෙයක් බවයි. එහි අගක් මුලක් නැත. කාලය අතින් අසීමිතය. අපරිමිතය. එහි තැන් තැන්හි සිදුවන කුඩා පිපුරුම් නිසා එසේ ප්‍රසාරණය සිදුවන බව පවසයි.

**ස්පන්දනමාන විශ්ව වාදය**

මෙම නවතම මතය ඉදිරිපත් කරන ලද්දේ විලියම් බෝනර් නම් බ්‍රිතාන්‍ය ජාතික තාරකා විද්‍යාඥයා විසිනි.

මේ මතයෙන් ප්‍රකාශ වන්නේ විශ්වයේ මුල, මැද හෝ අග නැති බව නොවේ. එය අනන්ත කාලයක් පවත්නා බවයි. එය අවස්ථාවක ඝන වස්තුවක් සේ එකට පැවතුණි. දැන් එය විසිරෙමින් පවතී. එසේ විසිර ගිය එය යළි එක්රැස් වේ. යළිත් විසිරේ. යළි එක්රැස් වේ යනුවෙන් පවසයි

මෙම මතය භෞතික විද්‍යාවේ නියමයන්ටත් අයින්ස්ටයින් විසින් හෙළි කළ සාපේක්ෂතාවාදයටත් බෙහෙවින් එකඟ බැව් පැවසේ. එහෙත් මෙය විශ්වයේ සම්භවය විස්තර නොකරයි.

බ්‍රිතාන්‍ය ජාතික ස්ටීවන් හෝකින්ස් නම් විද්‍යාඥයා විසින් විශ්වය පිළිබඳව විස්තර කිරීමට ක්වොන්ටම් යාන්ත්‍රික විද්‍යාව උපයෝගී කරගෙන ඇත.

**පළමු හීලියම් හයිඩ්‍රජන් න්‍යෂ්ටිය ඇති වීම**

ආරම්භයේදී ළදරු විශ්වයේ උෂ්ණත්වය ඉතාමත් ඉහළ මට්ටමකයි පැවතුනේ. ඒ උෂ්ණත්වය සෙල්සියන්ස් අංශක ට්‍රිලියනයේ ඒවා ට්‍රිලියන 10000 ට වැඩියි. පදාර්ථ ඇතිකර ගැනීමට නොහැකිව ක්වාර්ක් යනුවෙන් හැඳින්වෙන මූලික අංශු ඒ වන විට ඉතා උකු අංශු සූපයක කැලතෙමින් තිබුණා. ඉන්පසු විශ්වයේ වයස තත්පරයකින් අංශුමාත්‍රයක් වූ විට විශ්වයේ උණුසුම සෙල්සියන්ස් අංශක ට්‍රිලියන 10 දක්වා අඩු වුණා. එසේ උෂ්ණත්වය අඩු වූ විට ක්වාර්ක් නැමැති මූලික අංශු එකතු වීමෙන් ප්‍රෝටෝන හා නියුට්‍රෝන බිහිවුණා. ඉන්පසු විශ්වය බිහි වී විනාඩි 03ක් ගතවෙන විට විශ්වයේ උෂ්ණත්වය බිලියන 10 දක්වා අඩුවුණා. මේ උෂ්ණත්වයේදී ප්‍රෝටෝන හා නියුට්‍රෝන එකතු වීමෙන් හීලියම් න්‍යෂ්ටියත් ඉතුරු වුණ ප්‍රෝටෝනවලින් හයිඩ්‍රජන් න්‍යෂ්ටියත් බිහිවීම සිදුවුණා

**ප්‍රථම පරමාණු ඇති වීම**

විශ්වයේ වයස අවුරුදු 30000 ක් වූ විට විශ්වයේ උෂ්ණත්වය සෙල්සියන්ස් අංශක 3000කට පමණ අඩු වුණා. එවිට ප්‍රෝටෝන තවත් අංශු වර්ගයක් වන ඉලෙක්ට්‍රෝන සමඟ එක් වී ප්‍රථම පරමාණු එනම් හීලියම් හා හයිඩ්‍රජන් පරමාණු හැදුවා. එක ප්‍රෝටෝනයක් සහ නියුට්‍රෝනයක් සහිත හයිඩ්‍රජන් තමයි ඉතාමත් සරලම පරමාණුව. හීලියම් පරමාණුවට ප්‍රෝටෝන දෙකකුත් නියුට්‍රෝන දෙකකුත් ඉලෙක්ට්‍රෝන දෙකකුත් තියෙනවා.

(විශ්වයේ ඇති සමස්ත පරමාණු සංඛ්‍යාවෙන් 60% ක්ම හයිඩ්‍රජන් පරමාණු වන අතර 8% ක් පමණ හීලියම් පරමාණුයි. ජීවය සඳහා අතිශයින්ම වැදගත් වන මූලද්‍රව්‍ය ද ඇතුළුව අනෙකුත් සියලු මූලද්‍රව්‍යයන් ඇති වූයේ ඉක්බිතිව බිහි වූ තාරකා තුළයි. ඒ මූලද්‍රව්‍ය 89ම සතු ප්‍රමාණය විශ්වයේ ඇති මුළු පරමාණු ප්‍රමාණයෙන් 1% කට වැඩි නැහැ)

මීළඟ කලාපය තුළින් මුල්ම තාරකාව බිහිවීම හා තරකා විනාශ වීම පිළිබඳව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

# සමාජ විප්ලවය



විප්ලවය යන්නෙන් වෙනස් වීමක් යන සරල අදහස ගෙනෙන අතර එකී වෙනස සාමාන්‍ය වෙනසක් නොව එකවර සිදුවන ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක වෙනසකි.

නමුදු සමාජ විප්ලවය යනු ප්‍රගතිශීලී බලවේග විසින් සාක්ෂාත් කරනු ලබන, සමාජ ගුණාත්මක වශයෙන් නවමු හා සමාජ සංවර්ධනයේ වඩාත් උසස් මට්ටමකට ඔසවා තැබීමකි. එනම් ස්වකීය පහත් පැරණි, සමාජ ක්‍රමයක සිට අලුත්, වඩාත් දියුණු සමාජ ක්‍රමයක් කරා ගමන් කිරීමක් ලෙස මෙය හැඳින්විය හැකිය.

තාක්ෂණය, විද්‍යාව තුළ මෙන්ම ආර්ථිකය තුළ ද ගුණාත්මක වර්ධනයන් සිදුවන අතර විටෙක ඒවා විප්ලවීය ආකාරයක් ගනී. එහෙත් ඒවා සමාජ විප්ලව නොවේ. සමාජ විප්ලවයක් යනු සමාජ සංවර්ධනයේ ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක පරිවර්තනයකි. කෙටියෙන්ම පැවසුවහොත් සමාජ විප්ලවය යනු එක් පංතියක් අතින් තවත් පංතියක් අතට රාජ්‍ය බලය හුවමාරු වීමයි.

උදාහරණ ලෙස වහල්හිමි සමාජය බිඳ දමා වැඩවසම් සමාජය බිහිවීමත්, වැඩවසම් සමාජය බිඳ දමා ධනේශ්වරය නිර්මාණය වීමත් ඉතිහාසයේ සිදුවූ සමාජ විප්ලව 02ක් ලෙස හැඳින්විය හැකිය.

දේශපාලන ආර්ථික විද්‍යාවෙන් මෙය විස්තර කරන්නේ නම්, එය වඩාත් පුළුල් ලෙස වර්ධනය වූ නිෂ්පාදන බලවේග විසින් පැරණි නිෂ්පාදන සබඳතා පුපුරුවා හැර නව නිෂ්පාදන සබඳතා බිහිකර ගැනීමක් ලෙසට හැඳින්විය හැකිය. මෙය තවදුරටත් විස්තර කළහොත් නිශ්චිත සමාජ ආර්ථික ක්‍රමයක මූලික ගැටුම පවතින්නේ නිෂ්පාදන සබඳතා හා නිෂ්පාදන බලවේග අතරය. පංති සමාජයේදී මෙම ගැටුම සතුරු ආකාරයක් ගනී. සමාජ ක්‍රමයක ආරම්භයේදී නිෂ්පාදන බලවේග හා නිෂ්පාදන සම්බන්ධතා අතර අන්‍යෝන්‍ය ලෙස සිදුවන පුළුල් වර්ධනයක් නැතහොත් අනුරූපීතාවක් දැකිය හැකිය. නමුදු සමාජ ක්‍රමයක් යල්පැන යත්ම වඩාත් වර්ධනය වන නිෂ්පාදන බලවේගවලට බාධා කරන, ගැටෙන තත්වයකට නැතහොත් අනුරූපී නොවන තත්වයකට නිෂ්පාදන සබඳතා පත්වෙයි. මෙම අවස්ථාවේදී එනම් නිෂ්පාදන බලවේගයන්ට නිෂ්පාදන සබඳතා මඟින් බාධා කරන විට නිෂ්පාදන බලවේග විසින් එම සබඳතා පුපුරුවා හැර නව සබඳතාවයන් බිහිකර ගනී. නව සමාජ ක්‍රමයකට ප්‍රධාන හේතු කාරණය වන්නේ මෙයයි. කිසියම් සමාජ ක්‍රමයක් තුළ සිදුවන මෙම පුපුරා යාම සමාජ විප්ලවයක් ලෙස හඳුන්වයි.

සමාජවාදී සමාජ විප්ලවය

මෙය ධනේශ්වර සමාජ ක්‍රමය නැතහොත් අද අප ජීවත් වන සමාජ ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමය දක්වා වන ගමනේ අතරමැදි පියවර ලෙස හැඳින්විය හැකිය. මෙය මූලික ලෙසම ලොව මෙතෙක් සිදුවූ සෑම ආකාරයකම සමාජ විප්ලවයන්ට වඩා වෙනස් ස්වරූපයක් ගනී. අතර පෙර සිදුවූ සමාජ විප්ලවයන්හි දී එක් සූරාකන පංතියක් අතින් තවත් එක් සූරාකනු ලබන පංතියක් අතට බලය හුවමාරු වීම සිදුවූ අතර මෙහිදී ඉතිහාසයේ ප්‍රථම වතාවට පීඩක පංතිය අතින් පීඩිත පංතිය අතට බලය ගැනීම සිදු වේ. මෙතෙක් ලොව පැවති සියලු විප්ලව සූරාකෑම හා පංති පාලනය අහෝසි නොකොට නව ආකාරයකින් පවත්වාගෙන ගිය අතර සමාජවාදී සමාජ විප්ලවය මඟින් සූරාකෑමත්, පංති විෂමතාවයත් අහෝසි කර දමයි.

කෙසේ වුවද සමාජවාදී සමාජ විප්ලවය යන ඉතිහාසයේ සිදුවූ සෙසු විප්ලවයන් මෙන් ඉබේ සිදුවන්නක් නොවන අතර ධනවාදී ප්‍රාග්ධනය හා ධනවාදී රාජ්‍ය බලය සමඟ සෘජුව හා එකට බැඳී පවතින්නකි. එබැවින් එහි පැවැත්ම බිඳ දැමීමකින් තොරව සමාජවාදී සමාජයක් නිර්මාණය කළ නොහැක.

# ලොව විශාලතම මගී නෞකාව

ලොව දැනට ඇති විශාලතම මගී නෞකාව ලෙස Harmony of the Seas සැලකෙනවා. මෙම නෞකාව දිගින් මීටර 361.12ක් වෙනවා. බහමාස් හි ලියාපදිංචි කර තිබෙන මෙම නෞකාව කැබින් 2,747කින් යුතු වන අතර මගීන් 6,780ක් රැගෙන යාමේ හැකියාවක් පවතිනවා. මෙම නැවේ සේවකයන් 2,100ක් සේවය කරනවා. නෞකාවේ මුළු බර ටොන් 226,963ක්. එහි යන මගියෙකුට වර්ග 340ක වයින් හා වර්ග 40ක පමණ බීර වර්ග රස බැලීම කළ හැකියි. එමෙන්ම මෙම නෞකාවේ දිනකට ජලය ලීටර මිලියන 1.8ක් පමණ භාවිතා වන බවත් වාර්තා වෙනවා. 2015 දී මේ නෞකාව නිර්මාණය කිරීමට වෙනුවෙන් වැය වී ඇති මුදල ඇමරිකානු ඩොලර් බිලියන 1.35 කී.





මේ වයස අවුරුදු 13 ක දැරියකි. ඇය නමින් ඔමයිරා සංචෙස්ය. වර්ෂ 1985 දී කොළොම්බියාවේ පුපුරා ගිය ඩෙල් රැයිස් ගිනි කන්දේ ලාවා සහ මඩ තට්ටු මෙන්ම අතිවිශාල කොන්ක්‍රීට් තට්ටුවකට ද සිරවුණු ඇය, තමා බේරා ගැනීමට උත්සාහ දරන සහන සේවකයින් දෙස බලා සිටියේ මෙලෙසය. මෙම විපතෙන් ගම්මාන 16 ක් සුන්බුන් බවට පත්වූ අතර මරණ 23,000 ක් වාර්තා විය.

පුරා දින 03 ක් තිස්සේ උත්සාහ කළද ඇයව යටකරගත් කොන්ක්‍රීට් තට්ටුව එසවීමට සහන සේවකයින්ට නොහැකි විය. ඉතා දුර්වල ගලවාගැනීමේ මෙහෙයුම් හමුවේ තුන්වන දිනය අවසානයේදී ඇගේ දෑස් ඉදිමී කළු පැහැයට හැරී තිබිණි. ඒ ඇය විඳි වේදනාවේ තරම නිසාවෙනි. ඇයට දිරිදෙමින් සහන සේවකයන් සහ වෛද්‍යවරු ඇය බේරාගැනීමට උත්සාහ කරනා අතරතුර දී වේදනාවෙන්ම පරිපීඩිතව ඇය මිය ගියාය.

මෙම ඡායාරූපය ලබාගත් ඡායාරූප ශිල්පියා වන්නේ ෆ්‍රෑන්ක් ෆෝනීර්ය. ඔහු විසින් මුලදී මෙය පළකිරීමට බිය විය. ඒ ඔමාරියා ඔහුගේ දෑස් ඉදිරිපිට මිය ගිය බැවිනුත්, "ගිජුලිහිණියා සහ ළමයාගේ" ඡායාරූපය ඉදිරිපත් කළ ශිල්පියාට ජනතා අපවාදය නිසා සියදිවි නසාගැනීමට සිදුවූ කරුණත් මෙනෙහි වීමෙනි.

නමුත් ඔමාරියා විඳි වේදනාව ලෝකයාට පැවසීමට තීරණය කළ ඔහු අවසන එය ලෝකයට ඉදිරිපත් කළේය. 1986 දී පැවති Press Photo උළෙලේදී මෙම ඡායාරූපයට ලොව පළමු වැනි ස්ථානයද ලැබිණි.






# ඉත්තෑවගේ ගෙට කබල්ලෑවා රිංගීම හෙවත් පලස්තීනයට ඊශ්‍රායලයේ කඩාවැදීම



කාලාන්තරයක් තිස්සේ ලෝකය උණුසුම් කළ තවත් අරගලයක් ලෙස ඊශ්‍රායල් - පලස්තීන ගැටුම හඳුන්වන්නට පුළුවන්. බලහත්කාරී ලෙස පලස්තීනය ආක්‍රමණය කරමින් සිදුකරනු ලබන ජනාවාසකරණය, ලොව පුරා රටවල බලවත් විරෝධය මධ්‍යයේ පවා තවදුරටත් පවත්වාගෙන යාමට ඊශ්‍රායලය කටයුතු කරමින් සිටී. ඒ ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන්ගේ හා අන්තවාදී කණ්ඩායම්වල සහයෝගයෙනි.

ආර්ථිකමය හා දේශපාලනමය වශයෙන් ද ඉතා වැදගත් වූ මැදපෙරදිග කලාපය තුළ තම බල ව්‍යාප්ති දියත් කිරීම සඳහා අධිරාජ්‍යවාදීන් විසින් නිර්මාණය කරන ලද මෙහෙයුම් මධ්‍යස්ථානය බවට පත්වූයේ ඊශ්‍රායලයයි. වාර්ෂිකව යුද ආධාර ලෙස ඩොලර් බිලියන ගණනින් එක්සත් ජනපදය විසින් ඊශ්‍රායලය වෙත පොම්ප කරන්නේ මෙකී අරමුණ සහිතව බව ලෝකයටම නොරහසකි. කොටින්ම කියතොත් යුදෙව්වන් හා පලස්තීනුවන් අතර හටගෙන ඇති මේ අර්බුදය දඩමීමා කරගනිමින් හා ඊට පෝෂණය සපයමින් කටයුතු කිරීමට අධිරාජ්‍යවාදීන් පෙළඹී ඇත.

ඉඳින් පලස්තීනය මුහුණ පා ඇති මේ අර්බුදයේ අක්මුල් ක්‍රි.පූ 1250 තරම් ඈතකට විහිදී යනු ඇත. යුදෙව් ආගමික පුරාවෘත්තීන්ට අනුව ඊජිප්තුවේ වහල් සේවයේ යෙදී සිටි යුදෙව්වන්ව දෙවියන් විසින් නිදහස් කරගෙන පැමිණ ඇති අතර ඔවුන් දෙවියන්ට කීකරුව සිටියහොත් "පොරොන්දු දේශය" එසේත් නැතිනම් "සියොන් දේශය" වෙත රැගෙන යාමටද දෙවියන් විසින් එකඟ වූ බව පැවසේ. ඒ අනුව වර්තමාන ජෙරුසෙලම පිහිටි ප්‍රදේශය යනු සිය ඓතිහාසික පුරාවෘත්තයන්හි සඳහන් එම භූමියම බවට යුදෙව්වරු තර්ක කරති. මෙම මතවාදයේ බලපෑම හා ලොව පුරා වෙසෙන සියලු යුදෙව්වන් එක් රටක් තුළ සංවිධානය වීමේ යුදෙව්වාදී අවශ්‍යතාවය පදනම් කරගෙන පැනනැගී "සියොන්වාදය" විසින් පලස්තීනය තුළ ඊශ්‍රායලයක් නිර්මාණය වීම සඳහා අවශ්‍ය මතවාදීමය බලපෑම එල්ල කරන ලදී.

මේ අතර දෙවන ලෝක යුද සමය වන විටත් පලස්තීනය එක්සත් රාජධානියේ යටත් විජිතයක්ව පැවති අතර එම කාලය තුළ තම රටට පූර්ණ නිදහස දිනාගැනීමේ අරමුණින් යුතුව පලස්තීනුවන් විසින් බ්‍රිතාන්‍යයට සිය සහයෝගය පළ කළේය. ඉන් නොනැවතී හිට්ලර්ගේ හමුදා විසින් සොය සොයා මරණයට පත් කරනු ලැබූ යුදෙව්වන් සිය දහස් ගණනකට රැකවරණය සැලසීමට පවා පලස්තීනය ඉදිරිපත් විය.

අවසානයේ දී බ්‍රිතාන්‍ය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන්ගේ ද දැනුවත්භාවය හා මැදිහත් වීම මත එසේ පලස්තීනයට ඇදී එන යුදෙව්වන් ප්‍රමාණය ඉතා විශාල විය. එසේම එම යුදෙව්වන් විසින් පලස්තීන භූමිය ද බිඳෙන් බිඳ අත්පත් කරගන්නට විය. අවසන 1948 මැයි වන විටත් එතෙක් ලෝක සිතියමේ සටහන්ව නොතිබූ රටක් ලෙස "ඊශ්‍රායලය" යනුවෙන් යුදෙව්වන්ගේ දේශයක් පලස්තීනය තුළ නිර්මාණය විය. එහිදී එක්සත් ජාතීන්ගේ යෝජනාවක් අනුව පලස්තීන භූමියෙන් 55% ක් ජනගහනයෙන් 30% ක් වූ ඊශ්‍රායලයටද භූමියෙන් 45%ක් ජනගහනයෙන් 70%ක් වූ පලස්තීනයටද වෙන්කරමින් තිර ලෙසම පලස්තීනය ගිලගනිමින් ඊශ්‍රායලය බිහි කිරීමට අවශ්‍ය ඉඩකඩ නිර්මාණය කෙරිය. එහෙත් එයිනුදු නොනැවතී තවදුරටත් පලස්තීන භූමිය කොල්ලකෑමට ඊශ්‍රායලය තවමත් කටයුතු කරමින් ඇත. අද වන විට ඊශ්‍රායලය විසින් අත්පත් කරගෙන ඇති මුළු භූමි ප්‍රමාණය 90%කටත් වැඩිය. ඉඳින් පලස්තීනුවන්ගේ දේශයට ඊශ්‍රායල්වරුන්ගේ කඩාවැදීම සිදු වූයේ මේ ලෙසිනි.

ඉඳින් මෙවන් වටාපිටාවක් තුළ පලස්තීනුවන්ට සිදුවී ඇති අසාධාරණය ඉතා පැහැදිලිය. කිසිසේත්ම ස්වභාවික නොවන ක්‍රියාවලියක් තුළ මේ වන විටත් සිය උපන් බිමේ අනාථයින් බවට පලස්තීනුවන් පත්ව ඇත. ඔවුන්ට නිදහසේ ජීවත් වීමට ඇති අයිතිය කොන්දේසි විරහිතව පිළිගැනීම ලොව කොතැනක වුව මානවවාදය, සාධාරණත්වය හා යුක්තිය අගයන කාගේත් වගකීමයි. එසේම පලස්තීනුවන් වෙත එකී යුක්තිය හා නිදහස දිනාගත හැක්කේ අධිරාජ්‍යවාදයටත් ඔවුන්ගේ වුවමනාවන් ඉටුකරනු ලබන ධනේශ්වර පාලකයින්ටත් එරෙහි අඛණ්ඩ අරගලයකින්ම පමණි. ඒ සඳහා පලස්තීන වැසියන් එදා මෙන්ම අදත් හෙටත් නිර්භීතව සටන් වදිනු ඇත.

## SYU හා ශ්‍රී ලංකාවේ පලස්තීන තානාපති අතර හමුවක්



සමාජවාදී තරුණ සංගමය හා ශ්‍රී ලංකාවේ පලස්තීන තානාපති සුහයිර් හම්දලාහ් සයිඩ් මහතා අතර හමුවක් පසුගිය නොවැම්බර් 13 දින ශ්‍රී ලංකාවේ පලස්තීන තානාපති කාර්යාලයේදී පැවැත්විණි. නොවැම්බර් 29 දිනට යෙදී ඇති ජාත්‍යන්තර පලස්තීන සහයෝගීතා දිනය වෙනුවෙන් පැවැත්වීමට නියමිත වැඩසටහන් පිළිබඳව හා දෙරටෙහි දේශපාලන තත්වය පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරිණි.

මේ සඳහා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක චිරංග ගුණසේකර සහෝදරයා, ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් අංජන සම්පත් අමරසිංහ සහෝදරයා හා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා සහභාගී වූහ.

## WFDY වෙත නව උප සභාපතිවරයෙක්



ලොව විශාලතම අධිරාජ්‍ය විරෝධී හා ප්‍රගතිශීලී තරුණ සංවිධානය වන ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය (WFDY) හි නව උප සභාපතිවරයා ලෙස සමාජවාදී තරුණ සංගමයේ වෛද්‍ය ලසන්ත අබේවර්ණ සහෝදරයා පසුගිය දා පත් විය.

ඊට පෙර එම ධූරය පුබුදු සමරවීර සහෝදරයා විසින් දැරූ අතර පක්ෂයේ වෙනත් වගකීමක් දැරීම සඳහා ඔහු එම ධූරයෙන් ඉවත් විය.

මේ වන විටත් ලසන්ත අබේවර්ණ සහෝදරයා විසින් හංගේරියාවේ බුඩාපෙස්ට් හි පිහිටි WFDY මූලස්ථානයේ රැඳී සිටිමින් එම ධූරයේ කටයුතු සඳහා මැදිහත් වෙමින් සිටී.

## දිවා-රාත්‍රී වොලිබෝල් තරඟාවලිය දෙවන වරටත්

ගාල්ල දිස්ත්‍රික් සමාජවාදී තරුණ සංගමය හා සිංහ ක්‍රීඩා සමාජය සංවිධාන කරනු ලබන අන්තර් ක්‍රීඩා සමාජ දිවා-රාත්‍රී වොලිබෝල් තරඟාවලිය දෙවන වරටත් සංවිධානය කර ඇත. එය දෙසැම්බර් මස 03 වැනි දින පෙ.ව. 10ට ඇල්පිටිය මිරිස්වත්ත ක්‍රීඩාංගණයේදී ආරම්භ කිරීමට නියමිත බව එහි ප්‍රකාශකයෙක් පවසයි. මේ සඳහා ඉල්ලුම්පත් කැඳවා ඇති අතර තරඟය සඳහා අවශ්‍ය සියලු කටයුතු මේ වන විටත් සූදානම් කර ඇති බව තවදුරටත් දැනගන්නට ඇත.

## “සහෝදරත්වයේ දිනය” රෝමයේදී




සමාජවාදී තරුණ සංගමයෙහි රෝමයේ කමිටුව විසින් දෙසැම්බර් 10 වන දා සහෝදරත්වයේ දින වැඩසටහනක් සංවිධානය කර ඇත. එහි දී දේශන හා සංස්කෘතික ප්‍රසංගයක් ද පැවැත්වීමට නියමිතය. "කළු ජූලිය" නිර්මාණය වීමට පාදක වූ දිනය "සහෝදරත්වයේ දිනය" ලෙස නම් කර සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදරත්වය වෙනුවෙන් වන වැඩසටහන් සෑම වසරකදීම පැවැත්වීමට සමාජවාදී තරුණ සංගමය කටයුතු කරයි. එයට සමගාමීව විදෙස් රටවලද මෙම වැඩසටන සංවිධානය කරනු ලබන අතර එහි එක් පියවරක් ලෙස මෙය පැවැත්වේ.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 52/3, අතුරුගිරිය පාර, හෝමාගම පිහිටි ක්‍රියේටිව් ස්ටැම්ප් ඇන්ඩ් ප්‍රින්ටින් ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.